මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

# සතර අපායෙන් මිදීම උදෙසා දේවතානුස්සතිය






ඉදිරිපත් කිරීම සමන් ප්‍රනාන්දු

## මේ සටහන් තැබූ භික්ෂූන්වහන්සේගේ පුණ්‍යානුමෝදනාව

මාගේ ගුරුදේවයාණන් වහන්සේ වන
අති ගෞරවණීය දොඩම්පහල චන්ද්‍රසිරි
මහනායක ස්වාමීන්වහන්සේට ද
කල්‍යාණමිත්‍රභාවයෙන් උපකාර කළා වූ
සියළුම ගෞරවණීය ස්වාමීන්වහන්සේලාට ද
නිදුක් නිරෝගී සුවපත්භාවය පිණිසත්
මේ ජීවිතයේ දීම
චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධය පිණිසත්
මෙම ධර්මදානමය කුසලය හේතු වේවා...

ධර්ම දානය පිණිස නොමිලේ බෙදා හැරෙන සදහම් තිළිණයකි...

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

## සතර අපායෙන් මිදීම උදෙසා දේවතානුස්සතිය

2016.03.20 දින සිරස ගුවන් විදුලිය මගින් විකාශය වූ
පන්සිල් මළුව වැඩසටහනේදී
අති පූජ්‍ය රාජගිරියේ අරියඥාණ ස්වාමීන්වහන්සේ සමග
කරන ලද ධර්ම සාකච්ඡාව, අන්තර් ජාලයෙන්
උපුටාගෙන දහම් පඬුරක් ලෙස සකසා ඔබ සැමගේ
ධර්මාවබෝධය උදෙසා පිළිගන්වමු.

ඉදිරිපත් කිරීම

සමන් ප්‍රනාන්දු

**ධර්ම දානය පිණිසයි.....**

© සමන් ප්‍රනාන්දු

ප්‍රථම මුද්‍රණය: 2017 මැයි
තුන්වන මුද්‍රණය: 2017 මැයි

ISBN - 978-955-7887-21-0

**විමසීම් -**
දුරකථන: 0712199900
0112755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.30 සිට ප.ව. 4.00 දක්වා)

මුද්‍රණය සහ බෙදාහැරීම

ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්
444/3B, පිටිපන දකුණ, හෝමාගම

(සෝයා තෙල් භාවිතයෙන් නිපදවනු ලැබූ, විෂ රහිත, පරිසර හිතකාමී තීන්ත භාවිතයෙන් මුද්‍රිත යි.)

මේ ඝෝර කටුක භයානක සංසාරයේ
තියදුක, මේ ආත්මභාවයේදීම
සසර දුකින් එතෙර වීමට
අධිෂ්ඨානය කරගෙන වීර්ය වඩමින්
රිවෙන් ඔබ ලග ඇති "දුක්ඛ"
නිසි පරිදි උතුමාව වමනාත්
මේ අනිච්ච ස්වභාවය
ප්‍රකාරයෙන් වේවා, ක්‍රියාකාරීව පවා
අර්ථයෙන්ම වේවා
තම තමාම එලවන සුමාරයෙන්
තම තමාගේ ජීවිත වල්ලා ගලවා ගන්නවා.
අද හෝ සියාකාරීව වරද් අනුගත
ඔබ නොකල වරදකට
ඔබ නොගලවන්.
සැනුකවර අනුකම්පා කෙරෙනවා
මිදෙද නාත්තම් සමෙරද් වෙය
සමෙරද ලොව දකිනවා.
මෙහි සඳහන් කළ අප්‍රමාදී ලොවා
ඔබ සැමම සැනසෙන් වේවා,
තම තමාටම පිහිට කොට ගන්නවා.

*(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂුන් වහන්සේ විසින් ලියූවකි.)*

# දේවතානුස්සතිය

## ප්‍රශ්නය

**ගෞරවණීය ස්වාමීන් වහන්ස, දේවතානුස්සතිය වැඩීම, ගිහි ජීවිතයක් ගත කරන කෙනෙකුට සුදුසු යි කියා බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබෙනවා ද?**

## පිළිතුරු

මෙහෙමයි. දැන් ගිහි පින්වතුන්ලා කියන්නේ නිරතුරුව ම බැඳීම් මත ජීවත් වෙන පිරිසක් නේද? දුවා දරුවෝ ඉන්නවා, රැකීරක්ෂා කරනවා, ව්‍යාපාර කරනවා. මේ අප්‍රමාණ වූ බැඳීම් තුළ ජීවත් වෙන පිරිසක් තමයි, ගිහි පින්වතුන්ලා කියන්නේ. එතකොට, ගිහි පින්වතුන්ලා උදෙසා බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන ධර්ම කාරණා තුළ ගිහි පින්වතුන්ලාට නිරතුරුව ම පහසුවෙන් වඩන්න පුළුවන් ධර්මතාවයක් තමයි, දේවතානුස්සතිය කියලා කියන්නේ. තේරුණාද?

ඒ කියන්නේ, දැන් මේ ජීවිතයේ උතුම් මනුෂ්‍යත්වයක් ලබාගත්තා. මේ මනුස්ස ජීවිතය දෙවියෙක් කියන තැනට ඔසවා තියන්න කියන කාරණය. එතකොට, මෙතනදී මේ කියන්නේ, දෙවියෙක් කියන්නේ මේ පන්සලක් ආශ්‍රිතව, ආරණ්‍ය ආශ්‍රිතව ඉන්න දෙවිවරු නෙවෙයි.

මෙතනදී, දේවතානුස්සතියෙදී බුදුරජාණන් වහන්සේ උපාදානය සකස් කරලා දෙන්නේ, අර තුසිතය, යාමය, නිම්මාණරතිය, පරනිම්මිත වසවර්තිය, තාවතිංසය, චාතුර්මහාරාජිකය කියන මේ සශ්‍රීක දිව්‍ය තලවල් කෙරෙහි උපාදානය සකස් කරගන්න කියලා. එහෙම නැත්නම් මේ මනුස්ස ලෝකය ආශ්‍රිතව තියෙන දිව්‍ය ස්වභාවයන් කෙරෙහි උපාදානය සකස් කරගෙන යන්න එපා.

එතකොට, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, නිරතුරුව ම දේවතානුස්සතිය වඩන්න කියලා. තේරුණාද? මේ දේවතානුස්සතිය වැඩීමට වයස් භේදයක් බලපාන්නේ නැහැ; ස්ත්‍රී පුරුෂ භේදයක් බලපාන්නේ නැහැ. පාසල් දරුවෙකුට වුණත් දේවතානුස්සතිය වඩන්න පුළුවන්; වයෝවෘද්ධ කෙනෙකුට වුණත් දේවතානුස්සතිය

වඩන්න පුළුවන්; පාසල් දරුවෙක් නිරතුරුව ම දේවතානුස්සතිය තුළ ජීවත් වෙනවා නම්, එයා වයසට යන්න වයසට යන්න, එයාට ශක්තිමත් ආකාරයෙන් දේවතානුස්සතිය වැඩෙනවා. ඒ නිසා දේවතානුස්සතිය වැඩීමේ මාර්ගය බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එතනදී, බුදුරජාණන් වහන්සේ මුලින් ම දේශනා කරන්නේ, බුදුරජාණන් වහන්සේගේ ගුණයන් නිරතුරුව ම සිහිපත් කරන්න කියනවා. තේරුණාද? බුදුරජාණන් වහන්සේගේ ගුණයන් නිරතුරුව ම නුවණින් දකිමින්, සිහිපත් කරමින් සජ්ඣායනය කරන්න කියනවා. ඒ වගේ ම, බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ ඥාණයන් නුවණින් දකින්න කියනවා; සජ්ඣායනය කරන්න කියනවා; ඒවායේ අර්ථයන් මෙනෙහි කරන්න කියනවා.

එතකොට, බුදුරජාණන් වහන්සේගේ ගුණයන් නුවණින් දකිද්දි, ඒ කියන්නේ, බුද්ධානුස්සතිය වඩද්දි, බුද්ධානුස්සතිය පුහුණු කරද්දි මොකද වෙන්නේ? බුදුරජාණන් වහන්සේ කෙරෙහි සිත ඍජුව පවතිනවා කියලා. සිත ඍජුව පවතිනවා කියන්නේ ඇයි? නො සැලී පවතිනවා.

දැන්, බුදුරජාණන් වහන්සේගේ ගුණයන් ගැන, ඥාණයන් ගැන එයාට සැකයක්, විචිකිච්ඡාවක් නැහැ. බුදුරජාණන් වහන්සේගේ ගුණයන් කෙරෙහි සිත ඍජුව පවතිනවා කියනවා. ඒ සිත, ඍජුව පවතින සිත සංහිඳෙනවා කියනවා. ඒ සංහිඳුණා වූ සිත සමාධිමත් භාවයට පත් වෙනවා ය කියල කියනවා.

එතකොට, දැන් මොකක්ද මෙතනදී කරන්නේ? අපි බුද්ධානුස්සතිය ප්‍රයෝජනයට අරගෙන, ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේගේ ගුණයන්, බුදුරජාණන් වහන්සේගේ ඥාණයන් නිරතුරුව ම නුවණින් මෙනෙහි කරමින්, නුවණින් දකිමින්, මේවා සජ්ඣායනය කරමින් නිරතුරුව ම අපි බුද්ධානුස්සතිය කෙරෙහි සිත ඍජු භාවයට පත් කරගන්නවා. සැකයක් නෑ; විචිකිච්ඡාවක් නෑ; මේ බුදුරජාණන් වහන්සේගේ ගුණයන් කෙරෙහි සැකයක් නෑ.

එතකොට, ඒ ඍජුව පවතින්නා වූ, බුද්ධානුස්සතිය කෙරෙහි ඍජුව පවතින්නා වූ සිත, අන්න සංසිඳෙනවා. සංසිඳෙනවා කියන්නේ, ධර්මයේ පස්සද්ධිය, සැහැල්ලුව සකස් වෙනවා. ඒ සැහැල්ලු වූ, පස්සද්ධි වූ සිත, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සමාධිමත් භාවයට, ඒ කියන්නේ, පංච නීවරණ යටපත් වුණා වූ ස්වභාවයට පත් වෙනවා කියලා.

දැන් එතකොට, මේ පංච නීවරණ යටපත් වුණා වූ ස්වභාවයට කොහොමද මේ සිත ගත්තේ? බුද්ධානුස්සතිය තුළින්. ඒ නිසා පින්වතුන්ලා නිරතුරුව ම... බුදුරජාණන් වහන්සේ, දැන් මේ දේවතානුස්සතියට යන මාර්ගයයි කියන්නේ.

බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ ගුණයන් බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ ඥාණයන් නිරතුරුව නුවණින් දකින්න. ඒ ගුණයන් නුවණින් මෙනෙහි කරන්න. ඒ ගුණයන් නිරතුරුව ම, උදේ හවා සජ්ඣායනය කරන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

## අතුරු ප්‍රශ්නය

**බුදු රජාණන් වහන්සේගේ එම ගුණයන් මෙනෙහි කරමින් සජ්ඣායනය කරන්නේ කොයි ආකාරයෙන් ද ස්වාමීන් වහන්ස?**

## පිළිතුර

පින්වතුන්ලා දෑස් පියාගන්න. මම කිවුවාට පසු කියන්න.

1. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ රාගාදී සකල ක්ලේශයන්, මතු නූපදිනා පරිද්දෙන් නසා සුපරිශුද්ධ වූ බැවින් 'අරහං' නම් වන සේක.''

2. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අතීත අනාගත, වර්තමාන යන කාලත්‍රයට අයත් වූ ද, කාලමුක්ත වූ ද සකල ධර්ම සමූහය පරොපදේශ රහිතව, තමන් වහන්සේ විසින් ම නො වරදවා දැන වදාළ බැවින් 'සම්මා සම්බුද්ධ' නම් වන සේක.''

3. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අතිශයින් සමෘද්ධ වූ අෂ්ට විද්‍යාවන් හා පසළොස් චරණ ධර්මයන් මනා කොට දත් හෙයින් 'විජ්ජාචරණ' නම් වන සේක.''

4. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ දාන ශීලාදී සම්‍යක් ප්‍රතිපත්තියෙන් අමෘත මහා නිර්වාණ පුරයට පැමිණි හෙයින් 'සුගත' නම් වන සේක.''

5. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ කාම ලෝක, රූපී ලෝක, අරූපී ලෝක යන තුන්ලෝකය ම නිරවශේෂයෙන් දැන වදාළ හෙයින් 'ලෝකවිදූ' නම් වන සේක.''

6. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අකීකරු සත්ත්වයන් මනා කොට දැමූ හෙයින් 'අනුත්තරෝ පුරිසධම්ම සාරථී' නම් වන සේක.''

7. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ දෙවියන් සහිත වූ තුන්ලෝකයාට ම, අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කරන ලද හෙයින් 'සත්ථා දේවමනුස්සානං' නම් වන සේක.''

8. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ චතුරාර්ය සත්‍ය ධර්මයන් තමන් වහන්සේ විසින් අවබෝධ කොට ගෙන, දහස් ගණන් දෙව්මිනිසුන්ට අවබෝධ කරවූ බැවින් 'බුද්ධෝ' නම් වන සේක.''

9. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ ආමිස පූජා, ප්‍රතිපත්ති පූජා සියල්ලට ම සුදුසු වූ හෙයින් 'භගවා' නම් වන සේක.''

*''දුක්ඛෙ ඤාණං බුද්ධ ඤාණං*
*දුක්ඛ සමුදයේ ඤාණං බුද්ධ ඤාණං*
*දුක්ඛ නිරෝධෙ ඤාණං බුද්ධ ඤාණං*
*දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදාය ඤාණං බුද්ධ ඤාණං*
*අත්ථ පටිසම්භිදෙ ඤාණං බුද්ධ ඤාණං*
*ධම්ම පටිසම්භිදෙ ඤාණං බුද්ධ ඤාණං*

*නිරුක්ති පටිසම්භිදෙ ඤාණං බුද්ධ ඤාණං*
*පටිභාන පටිසම්භිදෙ ඤාණං බුද්ධ ඤාණං*
*ඉන්ද්‍රිය පරොපරියත්තේ ඤාණං බුද්ධ ඤාණං*
*සත්තානං ආසයානුසයේ ඤාණං බුද්ධ ඤාණං*
*යමක පාතිහාරියේ ඤාණං බුද්ධ ඤාණං*
*මහා කරුණා සමාපත්තියා ඤාණං බුද්ධ ඤාණං*
*සබ්බඤ්ඤුත ඤාණං බුද්ධ ඤාණං*
*අනාවරණ ඤාණං බුද්ධ ඤාණං ති.”*

> *“ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අරහං නම් වන සේක.*
> *සම්මා සම්බුද්ධ නම් වන සේක.*
> *විජ්ජාචරණ නම් වන සේක.*
> *සුගත නම් වන සේක.*
> *ලෝකවිදූ නම් වන සේක.*
> *ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අනුත්තරෝ පුරිසධම්ම සාරථී නම් වන සේක.*
> *ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සත්ථා දේව මනුස්සානං නම් වන සේක.*
> *ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ බුද්ධෝ නම් වන සේක.*
> *ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ භගවා නම් වන සේක.*
> *ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ, සම්මා සම්බුද්ධ නම් වන සේක.*
> *සම්මා සම්බුද්ධ නම් වන සේක.*
> *සම්මා සම්බුද්ධ නම් වන සේක.*

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ආකාරයෙන් බුදුරජාණන් වහන්සේගේ ගුණයන්, බුදුරජාණන් වහන්සේගේ ඤාණයන් නිරතුරුව ම මෙනෙහි කරමින්, සජ්ඣායනා කරමින්, නුවණින් දකිමින් ජීවත් වෙන්න කියලා.

එතකොට, දැන් බුදුරජාණන් වහන්සේගේ ගුණයන් මෙනෙහි කරමින්, නුවණින් දකිමින් ජීවත් වෙනකොට සජ්ඣායනය කරමින් ජීවත් වෙනකොට, මොකක්ද සිද්ධ වෙන්නේ? මේ බුදුරජාණන් වහන්සේගේ ගුණයන් කෙරෙහි හිත ඍජුව පවතිනවා. හිත ඍජුව පවතිනවා කියන්නේ දැන් සැලෙන්නේ නෑ. නො සැලී පවතිනවා. බුදුරජාණන් වහන්සේ මේ සා ගුණයන්ගෙන්, මේ සා ඥානයන්ගෙන් අනූනයි කියන කාරණය විචිකිච්ඡාවකින් තොරව එයා දකිනවා. දකිමින් මොකද වෙන්නේ? දකිද්දි එයාගේ සිත සංසිඳෙනවා. සංසිඳුණ සිත, අන්න සමාධිමත් භාවයට, පංච නීවරණ යටපත් වුණා වූ ස්වභාවයට පත්වෙනවා.

දැන් බුද්ධානුස්සතියෙන් සිත සමාධිමත් කරගත්තා. පළවෙනි තැන මේක.

දෙවනුව, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ධම්මානුස්සතිය කෙරෙහි සිත ඍජුව පවත්වාගෙන යන්න කියලා. එතකොට, ධම්මානුස්සතිය කෙරෙහි සිත ඍජුව පවත්වන්නේ කොහොම ද? බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ධර්මයේ ගුණයන් නිරතුරුව ම දකින්න; නිරතුරුව ම මෙනෙහි කරන්න; මේ ධර්මයේ ගුණයන් නිරතුරුව ම සජ්ඣායනය කරන්න කියලා.

ඒ නිසා පින්වතුන්ලා විවේකීව ඉන්න සෑම වෙලාවක ම මේ ධර්මයේ ගුණයන් සජ්ඣායනය කරන්න. විවේකීව ඉන්න වෙලාවක මේ ධර්මයේ ගුණයන් නුවණින් මෙනෙහි කරන්න. මේ අර්ථය, තේරුම නුවණින් දකින්න.

එතකොට ධර්මයේ මුල් ම ගුණය කුමක් ද? ධර්මය ස්වාක්ඛාත ගුණයෙන් යුක්ත යි. ධර්මය ස්වාක්ඛාත ගුණයෙන් යුක්ත යි. එතකොට ධර්මය ස්වාක්ඛාත ගුණයෙන් යුක්ත යි කියන්නේ මොකක් ද? ඒ කියන්නේ, මේ රූපී, අරූපී, කාම කියන මේ සංකීර්ණ වූ ලෝක ධාතුව, බුදුරජාණන් වහන්සේ සරල කරලා, පහසු කරලා, මුල, මැද, අග වශයෙන් අපට දේශනා කරලා තියෙනවා. මේ සා සංකීර්ණ වූ ලෝක ධාතුවක්. අපට සිතන්න තබා මුකුත් ම කරගන්න බැරි

මේ සංකීර්ණ ලෝක ධාතුව, බුදුරජාණන් වහන්සේ කාරණා පහකට ගෙනල්ලා පෙන්වලා තියෙනවා, නෝනා.

මොකක්ද කාරණා පහ කියන්නේ? රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන කාරණා පහට මේ මුළු විශ්වය ම ගෙනල්ලා, බුදුරජාණන් වහන්සේ අපට පෙන්වලා තියෙනවා. ඒ වගේ ම ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මේ සාරසංඛ්‍ය කල්ප ලක්ෂ ගාණක් මැරෙමින්, ඉපදෙමින්, මැරෙමින්, ඉපදෙමින් ගලාගෙන එන මේ සත්ත්ව ජීවිතය... මේ ජීවිතයේ උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත්තේ නැත්නම්, තවත් කල්ප ගාණක් පටිච්ච සමුප්පන්නව ගලාගෙන යන මේ සත්ත්ව ජීවිතය, නෝනා පටිච්ච සමුප්පාද ධර්මය තුළින් අපට ගෙනල්ලා පෙන්වනවා.

ඒ පටිච්ච සමුප්පාද ධර්මය තුළ, බුදුරජාණන් වහන්සේගේ ජීවිතයත්, ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයත්, අල්ලාහ් තුමාගේ ජීවිතයත් මේ භව ගමනේ ගමන් කරන ස්වභාවය අපට මතු කරලා පෙන්වනවා, මේ පටිච්ච සමුප්පාද ධර්මය තුළ. ඒ වගේ ම මේ අසංඛ්‍ය කල්ප ලක්ෂ ගාණක් මේ දුකත්, සැපත් අතර දෝලනය වෙමින් එන මේ සත්ත්ව ජීවිතය මේ ජීවිතයේ දී ම නිරෝධය කරන්න අවශ්‍ය නම්, මේ දුක මේ ජීවිතයේ දී ම නැති කරන්න අවශ්‍ය නම්, අන්න බුදුරජාණන් වහන්සේ කාරණා හතරකින් මේ දුක නැති කරන මාර්ගය කියලා දෙනවා. කාරණා හතරයි, මොකක්ද? චතුරාර්ය සත්‍යය.

මුලින් ම බුදුරජාණන් වහන්සේ දුක ගැන දේශනා කරනවා. තෙවනුව දුකට හේතුව, තෘෂ්ණාව ගැන දේශනා කරනවා. සිව්වෙනුව තෘෂ්ණාව නැති කළොත් දුක නැති වෙනවා ය කියලා දේශනා කරනවා.

මෙන්න මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ කාරණා අට තුළින්, ඒ කාරණා අටට සම්මා ඤාණ, සම්මා විමුක්තිය කියන කාරණා දෙකත් එකතු වෙච්ච තැන, අසංඛ්‍ය කල්ප ලක්ෂ ගාණක් පටිච්ච සමුප්පන්නව ගලාගෙන ආපු මේ සත්ත්ව ජීවිතය නිරෝධය කරන්න, නිවන් අවබෝධ කරගන්න මාර්ගය අපට කියලා දෙනවා.

එතකොට, මෙන්න මේ ගුණය තමයි ධර්මයේ ස්වාක්ඛාත ගුණය කියන්නේ. එතකොට, මේ ලෝකයේ බෞද්ධ වේවා, අබෞද්ධ වේවා, දෙවියෙක් වේවා, එහෙම නැත්නම් සතර අපායේ සත්ත්වයෙක් වේවා කරන්නා වූ යම් අකුසල් ක්‍රියාවක් තියෙනවා නම්, ඒ සෑම අකුසල් ක්‍රියාවක් ම බුදුරජාණන් වහන්සේ කාරණ පහකට ගෙනල්ලා පෙන්වනවා.

මොකක්ද කාරණා පහ? පංච නීවරණ: කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ඡ කුක්කුච්ඡ, විචිකිච්ඡා. මේ ලෝකයේ ඕනෑ ම සත්ත්වයෙක් අකුසලය තුළ ඉන්නවා නම්, දුශ්ශීලභාවය තුළ ඉන්නවා නම්, ලෝභකම තුළ ඉන්නවා නම්, ද්වේශය තුළ ඉන්නවා නම් ඒ සෑම සත්ත්වයකුගේ ම ස්වභාවය, මේ කාරණා පහට ගෙනල්ලා බුදුරජාණන් වහන්සේ පෙන්වනවා. ඒ වගේ ම, යම් මනුෂ්‍යයෙක්, යම් දෙවියෙක්, යම් බ්‍රහ්මයෙක් කුසලය තුළ ජීවත් වෙනවා නම්, ශීලය තුළ ජීවත් වෙනවා නම්, ශ්‍රද්ධාව තුළ ජීවත් වෙනවා නම්... බුදුරජාණන් වහන්සේ කාරණා හතකට ගොනුකරලා ඒ ජීවිතය පෙන්වනවා.

ඒ කාරණා හත තමයි, සප්ත බොජ්ඣංග: සති, ධම්මවිචය, වීර්ය, පීති, පස්සද්ධි, සමාධි, උපේක්ඛා. එතකොට බලන්න, මේ සා සංකීර්ණ ලෝක ධාතුවක්, මේ සා සංකීර්ණ සත්ත්ව ජීවිතයක්, මේ සා සංකීර්ණ භව ගමනක්, මේ සා කාරණා පහකට ගොනු කරලා පංච උපාදානස්කන්ධය හැටියට අපට දෙනවා. ඒ කාරණා පහ තමයි රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාන කියන පංච උපාදානස්කන්ධය.

ඒ වගේ ම, මේ සා සංකීර්ණ මනුස්ස ජීවිතයක්, සතර සතිපට්ඨානය කියන කාය, චිත්ත, ධම්ම, වේදනා කියන කාරණා හතරකට ගොනු කරලා අපට බුදුරජාණන් වහන්සේ පෙන්වනවා. ඒ කාරණා හතර තුළින් මේ රූපය නිරෝධ වෙන මාර්ගය බුදුරජාණන් වහන්සේ අපට පෙන්වනවා. මෙන්න මේ ගුණය තමයි, ධර්මයේ ස්වාක්ඛාත ගුණය.

එතකොට, මේ ධර්මයේ ස්වාක්ඛාත ගුණය අපේ ඇස් ඉදිරිපිට තියෙනවද? නැද්ද? තියෙනවා. මේ සියලු ම ධර්මයන් ජීවමානව තියෙනවා.

එතකොට, නිරතුරුව ම ධර්මයේ ගුණයන් මෙනෙහි කරන කෙනා මුලින් ම මොකක්ද දකින්නේ? මේ ධර්මයේ ස්වාක්ඛාත ගුණය.

දෙවනුව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ස්වාක්ඛාත ගුණයට පස්සේ තියෙන ගුණය වන 'සන්දිට්ඨික' ගුණය. ධර්මයේ සන්දිට්ඨික ගුණය කියන්නේ, නෝනා මේ ජීවිතයේ දී ම ධර්මය දකින්න පුළුවන්, මේ ජීවිතයේ දී ම ධර්මය අවබෝධ කර ගන්න පුළුවන්. යම් කෙනෙකුට උතුම් සෝවාන් ඵලයට පත්වෙන්න ඕනෙ නම්, රහත් ඵලයට පත්වෙන්න ඕනෙ නම් මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළ වෙනකම් ඉන්න අවශ්‍ය නැහැ.

යම් කෙනෙකුට උතුම් සෝවාන් ඵලයට පත් වෙන්න ඕනේ නම් ඊළඟ ජීවිතයේ නැවත මනුස්ස ආත්මයක් ලබනකම්, නැත්නම් දෙවියෙක් වෙනකම් ඉන්න ඕනේ නැහැ. යම් මනුස්සයෙකුට, යම් පින්වතෙකුට, යම් දෙවියෙකුට, යම් බ්‍රහ්මයෙකුට අවශ්‍ය නම් මේ ජීවිතයේ දී ම උතුම් චතුරාර්ය සත්‍යය දකින්න, අවබෝධ කර ගන්න, මේ ජීවිතයේ දී ම එයාට උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න පුළුවන්. ඒක තමයි ධර්මයේ සන්දිට්ඨික ගුණය. ඊළඟ ජීවිතයට කල් දාන්න අවශ්‍යතාවයක් නැහැ. තේරුණාද? එතකොට බලන්න, වර්තමාන සමාජයේ කොච්චර නම් දෙනා මේ නිවන් මාර්ගය, නැතිනම් නිවන, නැත්නම් සෝවාන් ඵලය කියන කාරණය කල්දානවද කියලා. සමහරු ඊළඟ ජීවිතයේ මනුස්සයෙක් වෙලා සෝවාන් වෙනවා කියනවා. සමහරු ඊළඟ ජීවිතයේ දෙවියෙක් වෙලා සෝවාන් වෙනවා කියනවා. තව කෙනෙක් කියනවා, මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළ වෙනකම් සෝවාන් වෙන්න බෑ කියලා. දැන් මොකක් ද මේ අපි දකින්නේ? ධර්මයේ සන්දිට්ඨික ගුණයේ දුර්වල භාවය.

නමුත් ධර්මය සන්දිට්ඨිකව තියෙනවා. ඒ ධර්මය සන්දිට්ඨිකව තියෙනවා කියන්නේ මොකක් ද? තමා තමාට අවංක නම්, මේ ජීවිතය තුළ දී ම ධර්මය අවබෝධ කරන්න, දකින්න පුළුවන්. අන්න ඒක තමයි ධර්මයේ සන්දිට්ඨික ගුණය.

ධර්මයේ සන්දිට්ඨික ගුණයට පස්සේ ධර්මයේ තියෙන ගුණය තමයි 'අකාලික' ගුණය. ධර්මයේ අකාලික ගුණය කියලා කියන්නේ මොකක් ද? ධර්මය කල් නො යවා විපාක දෙනවා. බුදුරජාණන් වහන්සේ සතර සතිපට්ඨාන සූත්‍රයේ දී දේශනා කරනවා, යම් භික්ෂුවක් තමා කෙරෙහි

අවංකව, තමා තමාට අවංක වෙලා, බුදුරජාණන් වහන්සේට, ධර්ම රත්නයට, සංඝ රත්නයට අවංක වෙලා, යම් කෙනෙක් රුක්ඛ මූලයකට, ආරණ්‍යයකට, සුඤ්ඤාගාරයකට ගිහිල්ලා මේ උතුම් සතර සතිපට්ඨාන ධර්මයන් අවංකව ජීවිතයට එකතු කර ගත්තොත්, බුදුරජාණන් වහන්සේ සහතිකයක් දෙනවා එයාට. මොකක් ද සහතිකය? දවස් හතක් ඇතුළත උතුම් රහත් ඵලයට පත්වෙන්න පුළුවන් කියලා. මේ බුදුරජාණන් වහන්සේ දෙන පළමුවෙනි සහතිකය. යම් කෙනෙක් තමා තමාට අවංක වෙලා, බුදුරජාණන් වහන්සේට, ධර්ම රත්නයට, සංඝ රත්නයට අවංකභාවයට පත්වෙලා, සංසාර භය දැකලා, කාමයන්ගේ නිසරු භාවය දැකලා, ආරණ්‍යයකට, රුක්ඛ මූලයකට, සුඤ්ඤාගාරයකට ගිහිල්ලා, මේ සතර සතිපට්ඨාන ධර්මයන් ජීවිතයෙන් පුහුණු කළොත්, බුදුරජාණන් වහන්සේ පළමුවන සහතිකය දෙනවා, සතියක්, (දවස් හතක්) ඇතුළත එයා උතුම් රහත් ඵලයට පත් වෙනවා කියලා.

දෙවනුව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, එයාට දවස් හතෙන් උතුම් රහත් ඵලයට පත්වෙන්න බැරි වුණොත්, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, එයා නැවත, නැවත, නැවත, නැවත, තමා තමාට අවංකව, තෙරුවන්ට අවංකව, මේ සතර සතිපට්ඨාන ධර්මයන් පුහුණු කළොත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, එයා සති හතක් ඇතුළත උතුම් රහත් ඵලයට පත් වෙනවා කියලා.

දැන් පළමුවෙනි සහතිකය කොච්චරක් ද? දවස් හතෙන්. දවස් හතෙන් බැරි වුණොත්, අවංකව මාර්ගය වඩලා, බුදුරජාණන් වහන්සේ දෙවන සහතිකය දෙනවා, සති හතෙන් අනිවාර්යයෙන් ම රහත් ඵලයට පත්වෙන්න පුළුවන් කියලා.

එහෙමත් එයාට සති හතකින් රහත් ඵලයට පත් වෙන්න බැරි වුණොත්, ඒ භික්ෂුව තමා තමාට අවංකව, තෙරුවන්ට අවංකව, නැවත නැවත සතර සතිපට්ඨානය පුහුණු කරනව නම්, බුදුරජාණන් වහන්සේ තුන්වන සහතිකය දෙනවා, එයා උපරිම මාස හතක් ඇතුළත චතුරාර්ය සත්‍යය දකිනවා කියලා. දැන් එයාට සති හතෙන් දකින්න බැරි වුණා; සතියෙන් දකින්නත් බැරි වුණා.

එතකොට, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මාස හතකින් එයා අනිවාර්යෙන් ම චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්නවා කියලා. යම් හෙයකින් එයාට මාස හතක් ඇතුළතත් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්නට බැරිව යනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, එම භික්ෂුව තමා තමාට අවංකව, තෙරුවන්ට අවංකව නැවත නැවත නැවත, නැවත, මේ චතුරාර්ය සත්‍යය පුහුණු කළොත්, එයා උපරිමව අවුරුදු හතක් ඇතුළත චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්නවා කියලා. ඒක තමයි අවසාන සහතිකය.

ඒ කියන්නේ එහෙම නම් බුදුරජාණන් වහන්සේ අපට සහතිකයක් දෙනවා, උපරිම අවුරුදු හතක් ඇතුළත, මේ සතර සතිපට්ඨාන ධර්මයන් නිවැරදිව ජීවිතයෙන් පුහුණු කළොත්, අපට උතුම් චතුරාර්ය සත්‍යය, රහත් ඵලය අවබෝධ කරගන්න පුළුවන් කියලා.

මොකක් ද මේ ගුණය? ධර්මයේ අකාලික ගුණය. ධර්මය කල් නො යවා විපාක දෙනවා. කල් ගන්නේ නෑ. ඊළඟ ජීවිතයට, නැත්නම් තව භවයකට යන්න අවශ්‍යතාවක් නෑ. ධර්ම මාර්ගය තුළ අවංකව, තෙරුවන් කෙරෙහි අවංකව කටයුතු කළොත් කල් නො යවා ධර්මය විපාක දීමේ ගුණය තමයි නෝනා, ධර්මයේ අකාලික ගුණය.

ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ධර්මයේ හතරවන ගුණය. ඒ තමයි, 'ඒහිපස්සික' ගුණය. ඒහිපස්සික ගුණය කියන්නේ මොකක් ද? ධර්මය නිරතුරුව ම බබළනවා. තේරුණා ද? විවෘතයි. ධර්මය කාටවත් හංගන්න බැහැ. දැන් ඉර තියෙනවා. මේ ඉර කළු වලාවකින් වැහිලා ගියත් මොහොතකින් ආයිමත් ඉර බබළනවා. ඉර හංගන්න බැහැ කාටවත්. සඳ තියෙනවා. සඳ කළු වලාවකින් වැහුණත් මොහොතකින් ආයිමත් සඳ බබළනවා. කවදාකවත් සඳේ විවෘතභාවය කාටවත් නැති කරන්න බැහැ.

ඒ වගේ, ධර්මය කියන්නේ නෝනා, බබළනවා. ඒක කාටවත් සඟවන්න පුළුවන් කමක් නෑ. ඒක තමයි ඒහිපස්සික ගුණය කියලා කියන්නේ.

දැන් අපි කියමු, කෙනෙක් ශීලය තුළ ජීවත් වෙනවා නම්, අනිවාර්යෙන් ම ශීලයේ ආනිශංස ලෝකයට ප්‍රකටයි. හංගන්න බැහැ. එයාගේ ජනප්‍රියභාවය ප්‍රකට වෙනවා, එයාගේ බිය නැති ස්වභාවය ප්‍රකට වෙනවා, සිහිමුළා නොවී මැරෙනවා, සුගතියේ උපදිනවා, කියන මේ ආනිශංස ප්‍රකටයි, හංගන්න බැහැ.

යම් කෙනෙක් මෛත්‍රිය වඩනවා නම් එයාගේ ශරීරය ප්‍රසන්නභාවයට පත්වෙනවා; දෙවියන් මනුෂ්‍යයන්, අමනුෂ්‍යයන් එයාට ප්‍රිය වෙනවා. මේවා ප්‍රකටයි. මේවා සඟවන්න බැහැ.

යම් කෙනෙක් ලෝබකම දුරුකරලා මහා සංඝ රත්නයට, දන් දෙනවා නම්, එයාගේ ආයුෂ, වර්ණය, සැපය, බලය වැඩෙනවා. මේවා කවදාවත් හංගන්න පුළුවන්කමක් නැහැ.

යම් පුද්ගලයෙක් දුක තුළ ජීවත් වෙනවා නම්, අනිවාර්යෙන් ම ඒ පුද්ගලයා තෘෂ්ණාව තුළ ඉන්නවා. සඟවන්න පුළුවන් ද ඒක? බැහැ. යම් පුද්ගලයෙක් තුළ තෘෂ්ණාව තියෙනවා නම් දුක කියන කාරණය සඟවන්න පුළුවන් ද? බැහැ. අනිවාර්යෙන් ම ධර්මතාවයක්.

යම් පුද්ගලයෙක් නිරතුරුව ම සම්මා දිට්ඨිය තුළ ජීවත් වෙනවා නම්, ඒ සම්මා දිට්ඨියට අදාළ ලක්ෂණයන් එයාගෙන් හංගන්න පුළුවන් ද? ප්‍රකටයි සමාජයට.

යම් පුද්ගලයෙක් මැරෙන වෙලාවේ එයාට අකුසල් චිත්තයක් සකස් වුණොත්, එයා ඊළඟ උපදින්නා වූ නිරයේ උපත, නැත්නම් සතර අපායේ උපත එයා දකිනවා. හංගන්න පුළුවන් ද? බැහැ. එයා දකිනවා. ධර්මය විවෘතයි. මැරෙන වෙලාවේ අකුසලයක් සිහිපත් වුණොත් ඒ අකුසලයට අදාළ ඊළඟ උපත එයා දකිනවා. සඟවන්න බැහැ.

යම් කෙනෙක් පින් කරලා, කුසල් දහම් වඩලා ඊළඟ ජීවිතයේ දෙවියෙක් වෙනවා නම්, ඒ දෙවියෙක් වෙන කෙනා සාධුකාර දෙමින් හිනාවෙවී මැරෙනවා. මොකද, ධර්මය ප්‍රකටයි. ධර්මය සඟවන්න බැහැ.

එතකොට ඒ වගේ ම මේ ජාති, ජරා, ව්‍යාධි, මරණ ලක්ෂණ සහිත උපතක් තියෙනවා නම්, ඒ උපත නිසා සකස් වෙන්නා වූ ජාති, ජරා,

ව්‍යාධි, මරණ ලක්ෂණ කොච්චර පවුඩර් ගාලා, සුවඳ විලවුන් දාලා අපට යටපත් කරන්න පුළුවන් ද? බැහැ. ප්‍රකට වෙනවා. මතු වෙනවා. ධර්මය ප්‍රකටයි.

කෙනෙක් දිනෙන් දින වයෝවෘද්ධ භාවයට පත්වෙනවා කියන එක අපට කවදාකවත් හංගන්න පුළුවන් ද? බැහැ. ධර්මය ප්‍රකටයි.

ඒ වගේ ම කෙනෙක් අකුසල් කරනවා නම්, එයා තුළ පංචනීවරණ සකස් වෙනවාය කියන කාරණය හංගන්න පුළුවන් ද? බැහැ.

කෙනෙක් ධර්මය තුළ ජීවත් වෙනවා නම්, එයා තුළ සප්ත බොජ්ඣංග වැඩෙනවාය කියන කාරණය අපට හංගන්න පුළුවන් ද? හංගන්න බැහැ.

යමෙක් තුළ අවිද්‍යාව තියෙනවා නම්, එයා සංස්කාර රැස් කරනවා ය කියන කාරණය හංගන්න පුළුවන් ද? බැහැ.

සංස්කාර රැස්වෙනවා නම්, ඊට අදාළව විඤ්ඤාණයක් සකස් වෙනවා කියන කාරණය හංගන්න පුළුවන් ද? බැහැ.

යම් කෙනෙක් තුළ තෘෂ්ණාවක් තියෙනවා නම්, තෘෂ්ණාවට අදාළව උපාදානයක් සකස් වෙනවා ය කියන කාරණය හංගන්න පුළුවන් ද? බැහැ. උපාදානය තියෙන තාක්කල් භවයක් සකස් වෙනවා කියන කාරණය හංගන්න පුළුවන් ද? බැහැ. ප්‍රකටයි. ධර්මය විවෘතයි.

එතකොට මේ ධර්මයේ විවෘත වූ ගුණය තමයි, මොකක්ද? ඒහිපස්සික ගුණය.

ධර්මයේ තියෙන ඊළඟ ගුණය තමයි, 'ඕපනයික' ගුණය. එතකොට, මේ ඕපනයික ගුණය කියන්නේ මොකක් ද? තමා තුළින් තමා දකිනවා. තේරුණාද? අනුන් තුළින් නො වෙයි. පතපොතින් නො වෙයි. කවුරුත් කියපු දේකින්, අහපු දේකින් නෙවෙයි. තමා තුළින් තමා දකිනවා.

තමා තුළින් තමා දකින්නේ කොහොම ද? තමා උතුම් සෝවාන් ඵලයට පත් වුණොත්, තමා දකිනවා, තමා නැවත සතර අපායට වැටෙන්නේ නෑ කියලා. කවුරුවත් කියන්න ඕනේ නෑ. තමා තුළින් තමා දකිනවා. තමා උතුම් සෝවාන් ඵලයට පත් වුණොත්, එයා තමා තුළින් තමා දකිනවා, දැන් තමා තුළ සක්කාය දිට්ඨිය සිඳිලා කියලා.

යමෙක් සෝවාන් ඵලයට පත් වුණොත් එයා තමා තුළින් තමා දකිනවා, එයා අන්‍ය ශීල ව්‍රත කෙරෙහි තියෙන තෘෂ්ණාව එයාගෙන් සිඳුණා කියලා. එයා සෝවාන් ඵලයට පත්වුණොත් එයා තමා තුළින් තමා දකිනවා, එයා තෙරුවන් කෙරෙහි තියෙන විචිකිච්ඡාවෙන් මිදුණා කියලා. තමා තුළින් තමා දකිනවා. තමාට තව ආත්ම භාව හතයි. උපරිම මේ භව ගමනේ තියෙන්නේ කියන කාරණය, තමා තුළින් දකිනවා. කවුරුත් කියලා දීලා නෙවෙයි.

එතකොට, සකෘදාගාමී ඵලයට පත්වෙච්ච පින්වතා තමා තුළින් තමා දකිනවා. තමා තුළ කාම, රාග, පටිඝයන් අනුසය වශයෙන් තියෙන්නේ කියලා, මේ අළු යට තියෙන ගින්දර වගේ එයා දකිනවා. ඒ වගේ ම සකෘදාගාමී ඵලයට පත්වෙච්ච පින්වතා තමා තුළින් තමා දකිනවා, තමා මේ භව ගමනේ තව උපරිම ආත්ම භාව දෙකයි ජීවත් වෙන්නේ කියලා තමා තුළින් දකිනවා.

ඒ වගේ ම අනාගාමී ඵලයට පත්වෙච්ච පින්වතා තමා තුළින් තමා දකිනවා, තමා තුළ කාම, රාග, පටිඝයන් නිරෝධය වෙලා කියලා. නමුත් එයා තුළ මෝහය යම් ප්‍රමාණයකට තියෙනවා. ඒ වගේ ම අනාගාමී පින්වතා තමා තුළින් තමා දකිනවා, තමා තව එක ම එක ආත්ම භාවයක් තුළ මේ භව ගමන නිරෝධය කරනවා කියලා.

ඒ වගේ ම, යම් පින්වතෙක් උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගෙන රහත් ඵලයට පත්වුණොත්, ඒ රහතන් වහන්සේ තමා තුළින් තමා දකිනවා, තමා රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණයන් කෙරෙහි තෘෂ්ණාව නිරෝධය කළා කියලා. එයා දකිනවා, තමා තුළ භව තෘෂ්ණාව නිරෝධය වුණා කියලා. එයා තමා තුළින් තමා දකිනවා. ගිනිගොඩක් තියෙනවා. දර තියෙන තාක්කල් මේ ගිනිගොඩ ඇවිළෙනවා. මේ දර ඉවර වෙච්ච මොහොතේ, මේ ගිනිගොඩ තුළින්

ම ගින්දර නිවී යන්නේ යම් සේ ද, තමාගේ ජීවිතය උපාදානයකින් තොරව නිසා විඤ්ඤාණය තමා තුළින් ම නිවී යනවා; තමා තුළින් ම තමා දකිනවා.

ඒ වගේ ම ශීලයේ ආනිශංස තමා තුළින් තමා දකිනවා. දානයේ ආනිශංස තමා තුළින් තමා දකිනවා. මෛත්‍රිය වඩන කෙනා මෛත්‍රියේ ආනිශංස තමා තුළින් තමා දකිනවා. පින් කරන කෙනා ඊළඟට උපදින්නා වූ තැන තමා තුළින් තමා දකිනවා. පව් කරන කෙනා ඊළඟට උපදින්නා වූ තැන තමා තුළින් තමා දකිනවා. දැන් මොකක් ද මේකට කියන්නේ? ධර්මයේ ඕපනයික ගුණය.

ධර්මයේ ඕපනයික ගුණයට පස්සේ තියෙන්නේ, ධර්මයේ 'පච්චත්තං වේදිතබ්බෝ' කියන ගුණය. ඒ කියන්නේ, තමා තමාට අවංක නම්, තමා බුදුරජාණන් වහන්සේට, ධර්ම රත්නයට, සංඝ රත්නයට අවංක නම්, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, වයස් භේදයක් නැහැ, ලොකු කුඩා භේදයක් නැහැ, දුප්පත් පොහොසත් භේදයක් නැහැ, කුලවත් කුලහීන කියලා භේදයක් නැහැ, උගත් නූගත් භේදයක් නැහැ, ඕනෑ ම කෙනෙකුට මේ ධර්මය දකින්න, අවබෝධ කරගන්න පුළුවන්.

පච්චත්තං වේදිතබ්බෝ කියලා කියන්නේ, තමා තමාට අවංක නම්, දුප්පත් පොහොසත් භේදයක්, ලොකු කුඩා භේදයක්, උගත් නූගත් භේදයක්, කුලවත් කුලහීන භේදයක් බලපාන්නේ නෑ. තමා තමාට අවංක නම්, තෙරුවන්ට අවංක නම් තමාට මේ ජීවිතයේ මේ ධර්මය අවබෝධ කර ගන්න පුළුවන්.

දැන් බලන්න, අර චූල්ලපන්ථක හාමුදුරුවෝ, නිග්‍රෝධ පුංචි හාමුදුරුවෝ, දබ්බමල්ල පුත්ත පුංචි හාමුදුරුවෝ, සංකිච්ච පුංචි හාමුදුරුවෝ, සෝපාක පුංචි හාමුදුරුවෝ ළමා වයසේ දී ම රහත් ඵලයට පත්වෙනවා. එතකොට සාරිපුත්ත මහ රහතන් වහන්සේලා තරුණ වයසේ දී ම උතුම් රහත් ඵලයට පත්වෙනවා. ඒ වගේ ම බලන්න, මහා ධන කුවේර පන්තිවලින් ආපු අය පැවිදි වෙලා උතුම් රහත් ඵලයට පත්වුණා. ඒ වගේ ම අර සෝපාකලා, සුනීතලා වගේ පල්ලෙහා ම අඩියේ ඉඳන් දුප්පත් කුලහීන තැන්වලින් ආපු පින්වතුන්ලා උතුම් රහත් ඵලයට පත් වුණා.

ඒ වගේ ම, තමා තමාට අවංක නම්, නිරතුරුව ම තෙරුවන්ට අවංක නම්, මේ කිසි ම භේදයකින් තොරව උතුම් රහත් ඵලයට පත්වෙන්න පුළුවන්. දැන් ස්ත්‍රී පුරුෂ භේදයක් මෙතන තියෙනවා ද? නැත්නම් ගිහි පැවිදි භේදයක් මෙතන තියෙනවා ද?

දැන් බලන්න, අනේපිඬු සිටුතුමා බුදුරජාණන් වහන්සේ දකින පළමුවන දැක්මේ දී ම උතුම් සෝවාන් ඵලයට පත්වෙනවා. ඒ වගේ ම උග්ග ගෘහපතිවරයා බුදුරජාණන් වහන්සේගෙන් බණ අහලා ප්‍රථම දවසේ දී ම උතුම් අනාගාමී ඵලයට පත්වෙනවා. තේරුණා ද? වයස් භේදයක්, ස්ත්‍රී පුරුෂ භේදයක් තිබුණේ නැහැ.

දැන් බලන්න විශාඛාව. අපි විශාඛාව කියලා කියද්දී දකින්නේ කවුද? වයෝවෘද්ධ උපාසිකාවක්, එහෙමනේ කියන්නේ. විශාඛා උපාසිකාව කියලානේ අපි කියන්නේ. ඕනෑම කෙනෙක් විශාඛාවගේ චරිතය දකිද්දි අපි මොකක් ද දකින්නේ? විශාඛා උපාසිකාවගේ චරිතය දකිද්දි, වයෝවෘද්ධ උපාසිකාවක් කියන කාරණය තමයි දකින්නේ. නමුත් මේ විශාඛාව සෝවාන් ඵලයට පත්වෙන්නේ නෝනා, වයස අවුරුදු හතේ දී. එයා ඈත සම්මා සම්බුද්ධ ශාසනයක ඉඳලා, මේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ අග්‍රදායිකාව වෙනවා කියලා නියත විවරණ අරගෙන ආපු කාන්තාවක්. විශාඛාව වයස අවුරුදු හතේ දී උතුම් සෝවාන් ඵලයට පත්වෙන්නේ. නමුත් අපි විශාඛාව කියන උපාසිකාවගේ චරිතය ගත්තාම හැම වෙලාවෙම දකින්නේ, වයෝවෘද්ධ උපාසිකාවක් කියන කාරණය.

එදා බුදුරජාණන් වහන්සේගේ කාලයේ, මිගාර සිටු තුමාගේ පුත් පූර්ණවර්ධන සිටු කුමාරයාට විවාහයක් හොයනවා. පූර්ණවර්ධන කියන සිට කුමාරයා කෝටිපති සිටුවරයෙක්. නමුත් මේ පූර්ණවර්ධන සිටුවරයා බලාපොරොත්තු වෙන්නේ, විවාහයට බොහොම තැන්පත්, නිවුණ කාන්තාවක්. නමුත් දැන් අම්මලා තාත්තලා මනමාලියෝ බලන්න ගොඩක් එක්කන් ගියා. ඒ වුණාට එයාට සුදුසු කෙනෙක් ලැබුණේ නැහැ. නමුත් ඊට පස්සේ පූර්ණවර්ධන සිටුවරයාගේ අම්මා තාත්තා මොකද කරන්නේ? බමුණන්ව ගෙන්වනවා. ගෙන්නලා බමුණන්ට සල්ලි දීලා, දෙන්න දෙන්න ඈත ගම්මානවලට පිටත් කරනවා.

මොකටද මේ? පූර්ණවර්ධන සිටුවරයාට බොහොම තැන්පත්, සුදුසු, නිහතමානී මනමාලියක් හොයන්න.

දැන් මේ සල්ලි අරගෙන මෙහෙම ගිය බමුණෝ දෙන්නෙක් එක්තරා ගමකට යනවා. බමුණෝ දෙන්නා යද්දි හවස් වෙලා. ගෑනු දරුවෝ පිරිසක් නාන තොටුපළට නාන්න යනවා දකිනවා. විසිපහක විතර පිරිසක්. දැන් මේ පිරිස යනකොට බමුණෝ දෙන්නා කල්පනා කරනවා, "අපි හොයන ගෑනු ළමයා සමහර විට මෙතන ඉන්නත් පුළුවන්" කියලා. දැන් මේ දෙන්නා අර නාන තොටුපොළට ගෑනු දරුවෝ බැස්සට පස්සේ, එතැන තියෙනවා, අම්බලමක්. මේ අම්බලමට වෙලා මේ දෙන්නා බලන් ඉන්නවා, මේ ගෑනු දරුවෝ නාලා උඩට එනකන්.

මෙහෙම ඉන්න කොට කළු කරලා වහින්න එනවා හයියෙන්. දැන් වැහිපොදත් වැටෙනවා. ඔන්න වැහිපොද වැටෙන කොට, අර හිටපු ගෑනු ළමයි ටික මොකද කළේ? අම්බලමට දුවගෙන ආවා. දැන් සමහරු කොණ්ඩ කඩාගෙන, ඇඳුම් බාගෙට ඇඳගෙන, වැස්සෙන් බේරෙන්න දුවගෙන අර ළමයි ටික අම්බලමට ආවා. අම්බලමේ අර බමුණෝ දෙන්නත් ඉන්නවා. දැන් ඔන්න වහින්න ගත්තා. මහා වැස්සක් කඩාගෙන හැලුණා.

මේ මහා වැස්ස කඩාගෙන හැලෙද්දි නෝනා, බමුණෝ හිතා ගෙන හිටියෙ ඔක්කොම ළමයි ආවා කියලා. නමුත් අර මහා වැස්සට තෙමිතෙමී එක ගෑනු ළමයෙක් එනවා. ඒ ළමයා බොහෝ ම සන්සුන්ව දෙපා තබමින්, සන්සුන් ඉරියව්වෙන් තමයි එන්නේ. මේ ගෑනු ළමයා දකිද්දී, එක බමුණෙක් අනෙක් බමුණාට කියනවා, "මේ කෙල්ල නම් හරි ම කම්මැලි කෙල්ලෙක්. බලන්න, මේ ගෑනු ළමයි හැම දෙනා ම වැස්සෙන් බේරෙන්න දුවගෙන ආවා. නමුත් මේ කෙල්ල නම් හරි ම කම්මැලි කෙල්ලෙක්. මේ කෙල්ලට බැනලා වැඩක් නෑ. කෙල්ලව හදපු අම්මා තාත්තටයි බනින්න ඕන" කියලා, එහෙම දැන් එක බමුණෙක් අනික් බමුණාට කියනවා.

දැන් මේක මේ ගෑනු දරුවාට ඇහුණා. දැන් මේ, තමන්ට කෙල්ල, කෙල්ල කියලා, මේ විදියට කම්මැලි කෙල්ලෙක් කියලා බනිනවත් මේ

ගෑනු දරුවට ඇහුණා. මේ ගෑනු දරුවා බමුණා ළඟට ඇවිල්ලා කියනවා, "මාමේ, ගෑනු දරුවෙක් වචනයෙන් සංවර වෙන්න ඕනේ; හැසිරීමෙන් සංවර වෙන්න ඕනේ; ඇඳුමෙන්, පැළඳුමෙන් සංවර වෙන්න ඕනේ. මාමේ, මේ වගේ වැසි සීයක් වැස්සත් මගේ සංවරකම කවදාවත් බිඳින්න බැහැ" කියලා. මොකක්ද මේ කියන්නේ? මාමේ "ගැහැණු දරුවෙක් ක්‍රියාවෙන් සංවර වෙන්න ඕනේ; හැසිරීමෙන් සංවර වෙන්න ඕනේ; වචනයෙන් සංවර වෙන්න ඕනේ. ඇඳුමෙන්, පැළඳුමෙන් සංවර වෙන්න ඕනේ. මාමේ, මේ වගේ වැසි සීයක් වැස්සත් මගේ සංවරකම බිඳින්න බැහැ" කියලා.

ඒ වෙලාවේ නෝනා, බමුණෝ දෙන්නා කල්පනා කරනවා, "අපි පූර්ණවර්ධන සිටුතුමාට සොයන සැබෑ ම මනමාලිය මේ තමයි" කියලා. එතකොට කවුද මේ දරුවා? විශාඛාව!

එතකොට බලන්න, මේ විශාඛාව, කියන්නේ ඒ වෙනකොට විශාඛාවට වයස අවුරුදු දාහතරක් විතර වෙන්න ඇති. එතකොට බලන්න, මේ අවුරුදු දාහතරක, සෝවාන් ඵලයට පත් වෙච්ච ගෑනු දරුවෙක්ගේ සිංහ නාදයක් ඒක. මොකක්ද ඒ සිංහ නාදය? "මාමේ, ගැහැනු දරුවෙක් වචනයෙන් සංවර වෙන්න ඕනේ; හැසිරීමෙන් සංවර වෙන්න ඕනේ; ඇඳුමෙන්, පැළඳුමෙන් සංවර වෙන්න ඕනේ. මාමේ, මේ වගේ වැහි සීයක් වැස්සත් ඒ සංවර භාවය බිඳින්න බැහැ" කියලා.

එතකොට දැන් මේ කාටද කියන්නේ? තමන්ට මේ කෙල්ල, කෙල්ල, කම්මැලි කෙල්ල කියලා බැනපු බමුණෝ දෙන්නට මේ කියන්නේ. එතකොට බලන්න, මේ අවුරුදු දාහතරේ, පහළොවේ වයසේ දී, විශාඛාව මෙවැනි සෝවාන් ඵලයට අදාළව ඒ උතුම් සිංහ නාදය කරන්නේ. නමුත් බලන්න, ඒ සෝවාන් ඵලයට පත්වෙච්ච ඒ තරුණ දරුවාගේ සිංහ නාදයත් එක්ක ගනිද්දි නෝනා, වර්තමාන සමාජයේ අපේ ගෑනු දරුවෝ දුවන, පනින, අඳින, පළඳින දේවල් දැක්කහම, අපේ ගෑනු දරුවෝ කවදා නම් සෝවාන් ඵලයට පත් වෙයි ද කියන කාරණය ඉස්සරහ ප්‍රශ්නාර්ථයක් විතරක් ම යි අපට තියන්න වෙන්නේ. ප්‍රශ්නාර්ථයක් විතරක් ම යි තියන්න වෙන්නේ. නමුත් මාර්ගය විවෘතව තියෙනවා. අවුරුදු දාහතරේ දරුවටත්, අවුරුදු හතේ දරුවටත් උතුම්

සෝවාන් ඵලයට පත්වෙන්න තියෙන මාර්ගය විවෘතව තියෙනවා. ඒ මාර්ගය විවෘතව තිබ්බත් ඇත්ත වශයෙන් ම අපේ පින්වත් ගැනු දරුවෝ කතාබහ කරන, හැසිරෙන, අඳින, පළඳින හැටි දැක්කහම, සෝවාන් ඵලය ඒ අයට කොච්චරක් ඈත් වෙයි ද කියන ප්‍රශ්නාර්ථය අපි ඉස්සරහ තියෙනවා. නමුත් පින්වත් දරුවෝ, මෙහෙම කිව්වට සමාවෙන්න ඕන. මොකද, මාර්ගය විවෘතව තියෙනවා. ඒ නිසා ඕනෑ ම වෙලාවක නිවැරදි භාවයට පත්වෙන්න පුළුවන්.

විශාඛාවට අවුරුදු හතේ දී උතුම් සෝවාන් ඵලයට පත් වෙන්නේ ධර්මයේ කුමන ගුණයක් නිසා ද? 'පච්චත්තං වේදිතබ්බෝ' කියන මේ ධර්මයේ ගුණය නිසා. එතකොට බලන්න, මේ ධර්මයේ මේ ගුණයන් නිරතුරුව ම නුවණින් දකින්න.

ස්වාක්ඛාතෝ ගුණය, සන්දිට්ඨික ගුණය, අකාලික ගුණය, ඒහිපස්සික ගුණය, ඕපනයික ගුණය, පච්චත්තං වේදිතබ්බෝ කියන මේ ගුණයන්ට අදාළව ගුණයන් නුවණින් දකිමින්, ජීවමානව ඒවා ජීවිතයට එකතුකර ගනිමින් ධර්ම රත්නය කෙරෙහි හිත ඍජුව පිහිටන්න කියනවා.

දැන් මේ විදිහට අපි ධර්මයේ ගුණයන් දකිද්දි මොකද වෙන්නේ? ධර්ම රත්නය කෙරෙහි හිත ඍජුව පිහිටනවා. සැලෙන්නේ නෑ, සැකයක් නෑ, විචිකිච්ඡාවක් නෑ. ධර්මයේ ගුණයන් අපට ඇස් දෙකට පේනවා; කන් දෙකට ඇහෙනවා. තේරුණා ද? එතකොට ධර්මයේ ගුණයන් කෙරෙහි හිත විචිකිච්ඡාවකින් තොරව හිත, ඍජුව පිහිටන කොට මොකද වෙන්නේ? ඒ හිත සන්සිඳෙනවා. ඒ සන්සිඳුණා වූ හිත මොකද වෙන්නේ? සමාධිමත් භාවයට, පංචනීවරණ යටපත් වුණා වූ ස්වභාවයට පත්වෙනවා.

බුද්ධානුස්සතිය තුළින් හිත සමාධියට ගත්තා. දෙවනුව ධම්මානුස්සතිය තුළින් අපි හිත සමාධියට ගත්තා.

තුන්වෙනුව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සංඝානුස්සතිය වඩන්න කියලා. මේ සංඝයාගේ ගුණ නිරතුරුව ම සිහිපත් කරන්න. මේ සංඝයාගේ ගුණ නිරතුරුව ම මෙනෙහි කරන්න. මේ සංඝයාගේ ගුණ නිරතුරුව ම සජ්ඣායනය කරන්න. මේ සංඝයාගේ ගුණයන්

නිරතුරුව ම ඇහෙන් දකින්න කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. තේරුණාද? එතකොට, මේ සංඝයාගේ ගුණයන් දකලා සංඝයාගේ ගුණයන් සජ්ඣායනය කරන කොට, මෙනෙහි කරන කොට මොකද වෙන්නේ? සංඝයාගේ ගුණයන් කෙරෙහි හිත ඍජුව පිහිටනවා. සැලෙන්නේ නෑ. අවබෝධාත්මකව හිත ඍජුව පිහිටනවා. විචිකිච්ඡාවක් නෑ එයාට.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඒ ඍජුව පිහිටියා වූ හිත, පස්සද්ධියට, සංහිඳීමට පත් වෙනවා කියලා. ඒ සංහිඳුණ හිත සමාධිමත් භාවයට පත් වෙනවා කියලා, දේශනා කරනවා.

සංඝයාගේ ගුණයන් කියන්නේ මොනවා ද? "සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ..."

සංඝයාගේ මුල් ම ගුණය තමයි, 'සුපටිපන්න ගුණය'. එතකොට, සුපටිපන්න ගුණය කියලා කියන්නේ මොකක් ද? සංඝයාගේ සුපටිපන්න ගුණය කියලා කියන්නේ, එයා කාමයන්ගේ නිසරු භාවය දකලා, සංසාර භය දකලා, මේ සත්ත්වයා මුදලට, ධනයට, රූපයට තිබෙන්නා වූ වහල් භාවය දකලා, එයා මේ සංසාර භය දකිමින් උතුම් පැවිදි උපසම්පදාවට පත් වෙනවා. සුපටිපන්න ගුණය කියන්නේ ඒකයි. සංසාර භය දකිනවා, කාමයන්ගේ නිසරු භාවය දකිනවා. සත්ත්වයා මේ තෘෂ්ණාවට ඇති දාසභාවය එයා දකිනවා. දකලා, එයා ගිහි ජීවිතයේ තියෙන නිසරු භාවය දකලා, ගිහි ජීවිතයෙන් අත්මිදිලා, එයා උතුම් පැවිදි උපසම්පදාවට පත් වෙනවා. ඒක තමයි සංඝයාගේ තිබෙන සුපටිපන්න ගුණය.

එතකොට බලන්න දැන් සාරිපුත්ත මහ රහතන් වහන්සේගේ, මුගලන් මහ රහතන් වහන්සේගේ සුපටිපන්න ගුණය කියන්නේ කොයි සා ශ්‍රේෂ්ඨ ගුණයක් ද? ඒගොල්ලෝ කෝටිපති බමුණු පවුල්වල දරුවෝ. කිසි ම අග හිඟයක් තිබ්බෙ නෑ; ප්‍රශ්නයක් තිබ්බෙ නෑ; පීඩාවක් තිබ්බෙ නෑ. මහේශාක්‍ය ජීවිත ගත කළේ. ඒ සා මහේශාක්‍ය ජීවිත අත්හැරලයි, සම්මා සම්බුද්ධ ශාසනයේ පැවිද්දට එන්නේ. ඒක තමයි සංඝයාගේ තියෙන සුපටිපන්න ගුණය.

එතකොට බලන්න, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ සුපටිපන්න ගුණය කියන්නේ මොකක් ද? මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ සුපටිපන්න ගුණය බලන්න. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ගිහි කාලයේ නම 'පිප්පලී'. මේ 'පිප්පලී කියන්නේ නෝනා, කෝටිපති බමුණු පවුලක තරුණයෙක්. එක දරුවයි හිටියේ ඒ අම්මට තාත්තට. කෝටි ගාණක් ධනය, දේපළ අම්මා තාත්තට තියෙනවා. කෝටිපති දේපලක් හිමි තරුණයෙක් මේ දෙමාපියන් මේ බමුණු තරුණයාට කියනව, "පුතේ, ඔබට දැන් කලවයස හරි. විවාහ වෙන්න ඕනේ" කියලා. නමුත් මේ බමුණු තරුණයා මේක කල් දමමින්, කල් දමමින් ආවා. දැන් අවසානේ මොකද වුණේ? පුතා කියන දේ අහන්නේ නැති නිසා අම්මාත් තාත්තාත් තීරණයකට එනවා, "පුතේ, පුතා කසාද බැන්දේ නැත්නම් අපි දෙන්නා දිවි නසා ගන්නවා" කියලා.

දැන් අම්මයි තාත්තයි මේ උපක්‍රමයක් කළේ, "පුතේ, ඔයා විවාහ වුණේ නැත්නම් අපි දෙන්නා දිවි නසා ගන්නවා" කියලා. දැන් පිප්පලීට වෙන කරන්න දෙයක් තිබ්බේ නැහැ. ඒ නිසා ඒ වෙලාවෙ කැමති වෙනවා, "අම්මේ, තාත්තේ, මම විවාහ වෙන්නම්" කියලා. ඊට පස්සේ සුදුසු මනමාලියක් හොයනවා. මේ සුදුසු මනමාලිය හොයද්දි මනමාලියක් හම්බ වෙනවා. ඇය තමයි 'භද්දකාපිලානා'.

භද්දකාපිලානා කියන්නෙත් නෝනා, කෝටිපති බමුණු පවුලක තරුණියක්. දැන් ඉතින් මේ මනමාලිය බමුණෙකු මාර්ගයෙන් තෝරා ගෙන, පිප්පලී යනවා මනමාලිව බලන්න, දෙමව්පියන් එක්ක. පිප්පලී දෙමව්පියන් එක්ක මනමාලිව බලන්න ගිහිල්ල, පිප්පලී මනමාලිට පෞද්ගලිකව කියනවා, "මට නම් මේ කාමයන් කෙරෙහි කිසි ම කැමැත්තක් නැහැ. මම කැමැත්තකින් නෙවෙයි මේ විවාහ වෙන්නේ. මගේ අම්මා, තාත්තා මට බලකරනවා, මම විවාහ නොවුණහොත් ජීවිතය නැතිකර ගන්නවා කියලා."

ඒ වෙලාවේ භද්දකාපිලානාත් කියනවා, "මමත් විවාහ වෙන්නේ කැමැත්තෙන් නෙවෙයි. මගේ අම්මා තාත්තාත් මට බලකරනවා. මටත් මේ කාමයන්ගේ නිසරු භාවය දැනිලා තියෙන්නේ. ඒ නිසා

මම විවාහ වෙන්නෙත් මගේ කැමැත්තෙන් නෙවෙයි" කියලා. දැන් ඔන්න දෙන්නට දෙන්නා ගැළපුණා. දැන් දෙන්න ම විවාහ වෙන්නයි යන්නේ. නමුත් දෙන්නා තුළ ම විවාහයට කැමැත්තක් නැහැ.

ඒ නිසා ඒ දෙන්නා ම ඒ වෙලාවේ තීරණයක් කරනවා, "හොඳයි, අපි අම්මා තාත්තාගේ සතුට උදෙසා විවාහ වෙමු. විවාහ වෙලා අම්මා තාත්තා මිය ගියාට පස්සේ, අපි මේ සියලු දේ අතහැරලා ගිහිල්ලා පැවිදි වෙමු" කියලා. මේගොල්ලෝ දැන් දන්නවා, බුදුරජාණන් වහන්සේ පහළ වෙලා ඉන්නවා කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ මුණගැහිලා හරි, හමුවෙලා හරි නෑ. ඒ ගමට බුදුරජාණන් වහන්සේ වැඩමවලා තිබුණෙත් නෑ.

දැන් ඔන්න මඟුල් ගෙදර දවස. විශාල ධනයක් වියදම් කරලා මහා මඟුල් ගෙයක් කළා. මනමාලි කවුද? භද්දකාපිලානා. මනමාලයා කවුද? පිප්පලී. දැන් මේ මහා මඟුල් ගෙදර කරලා නෝනා, ඒ අම්මා තාත්තා මේ දෙන්නට මධුසමය ගතකරන්න, ඒ බමුණු ගෙදර නිවසේ තියෙන, මහා මාලිගයේ තියෙන විශාල ම කාමරය සූදානම් කළා. සූදානම් කරලා මුළු කාමරය ම සුවඳ මලින් ඇතුරුවා. මුළු කාමරය ම පලතුරුවලින් තමයි සුවඳවත් කළේ. ඒ වගේ ම රනින් ගෙත්තම් කරපු පාවඩ, ඇඳ ඇතිරිලි, උඩු වියන් දැම්මා. ඒ මධුසමය ගතකරපු මධු කුටිය, නෝනා දිව්‍ය විමානයක් වගෙයි කියලා ධර්මයේ තියෙනවා.

දැන් මේ විවාහය සිද්ධ වෙලා මධුසමය ගත කරන්න තමන්ගේ කාමරයට ආවා. ඇවිල්ලා භද්දකාපිලානාව වාඩිකරගෙන පිප්පලී මොකද කළේ? අර මධු සයනයේ හරි මැදින් ඉරක් අඳිනවා. ඉර අඳින්නේ චෝක් කැල්ලකින්, එහෙම නැත්නම් කාබන් පෑනකින් නෙවෙයි. සතිය, සිහිය කියන කාබන් පෑනෙන් තමයි මේ මධු සයනය මැදින් ඉරක් අඳින්නේ. ඉරක් ඇඳලා එයා භද්දකාපිලානාට කියනවා, "භද්දකාපිලානා, මේ ඉර කවදාවත් තරණය කරලා මම ඉස්සරහට එන්නේ නැහැ; ඉක්මවා යන්නේ නැහැ. භද්දකාපිලානා, ඔබ මේ ඉර ඉක්මවා එන්න එපා" කියලා.

එහෙම එපා කියලා ඒගොල්ලෝ මධුසමය ගත කරපු ඒ රාත්‍රියත් නෝනා, බ්‍රහ්මචාරීවයි ගත කළේ. තමන්ගේ සයනය මත සතිය, සිහිය

කියන පැනෙන් ඉරක් ඇඳලා, මේ දෙන්නා මේ ඉර ඉක්මවලා ආවේ නෑ කවදාක්වත්. මුළු ජීවිත කාලෙ ම, අම්මා තාත්තා මැරෙනකන් ම එක ගෙදර, එක විවාහ ජීවිතයක් ගත කළා. හැමෝම හිතනවා, මේගොල්ලෝ විවාහ ජීවිතයක් ගත කරනවා කියලා. නමුත් මේ දෙන්නා අතින්වත් කවදාක්වත් ස්පර්ශ කළේ නෑ.

එතකොට එහෙම කරලා අම්මා, තාත්තා මැරෙනවා. මැරුණට පස්සේ දැන් දෙන්නා එක චිත්තයකින්... දෙපාරක් හිතුවේ නෑ. එක චිත්තයකින් සියලුම දේපළ අතහරිනවා. කහ, දුඹුරු පාට වස්ත්‍රයක් ඇඳගෙන මේ දෙන්න ම බමුණු ගෙදරින් පිටවෙනවා. ආයෙමත් හැරිලාවත් බැලුවේ නෑ, දේපළ දිහා.

මේ කියන්නේ, කාශ්‍යප මහ රහතන් වහන්සේගේ සුපටිපන්න ගුණය.

දැන් මේ දෙන්නා පාර දිගේ යන්න යනවා, අනාථයෝ දෙන්නෙක් වගේ. දැන් මෙහෙම යද්දී දෙමං හන්දියක් හම්බ වෙනවා. ඒ දෙමං හන්දියේ දී දෙන්නා නවතිනවා, දෙමං හන්දිය මැද්දේ.

නැවතිලා, පිප්පලී භද්දකාපිලානාට කියනවා, "භද්දකාපිලානා, අපි සංසාරයේ අසංඛ්‍ය කල්ප ලක්‍ෂ ගාණක් මේ විදිහට එකිනෙකා හමුවෙලා, එකිනෙකාට ආදරය කරමින්, එකිනෙකා විවාහ කරගෙන, එකිනෙකාට දරුවෝ හදාගෙන, අපි සංසාරයේ කල්ප සියක් කෝටි ගාණක් අපේ ආදර බැඳීම ගලාගෙන ආවා. නමුත් භද්දකාපිලානා, අපි මේ මොහොතේ වෙන් වෙන්න ඕනේ." මේ වෙන් වෙනවා කියන්නේ, මේ අසංඛ්‍ය කල්ප ලක්‍ෂ ගාණක ආදර බැඳීමක් මේ වෙන්කර ගන්න හදන්නේ. මේගොල්ලෝ ඒ සා ඈත ඉඳන් පෙම්වතුන් හැටියට, විවාහක අය හැටියට ගලාගෙන ආවා, පටිච්ච සමුප්පන්නව. ඒත් දැන් පිප්පලී කියනවා, "භද්දකාපිලානා, සංසාරේ ආවා වූ මේ දීර්ඝ ගමනට අපි සමුදීලා අපි දැන් වෙන් වෙන්න ඕනේ. ඒ නිසා භද්දකාපිලානා ඔබ මේ පැත්තට යන්න. මම මේ පාරේ යනවා" කියලා යනවා.

දැන් මේ යන්නේ, බුදුරජාණන් වහන්සේ හොයාගෙන. නමුත් උන්වහන්සේ කොහේ වැඩ ඉන්නවා ද කියලා මේගොල්ලෝ දන්නේ නෑ; දැකලත් නැහැ. දැන් මේ දෙන්නා මේ විදිහට, තීරණයක් අරගෙන

මහපාරෙදී දෙන්නා දෙපැත්තට වෙන්වෙනකොට ම, මහ පොළොව කම්පාවෙනවා. මහ පොළොව සෙලවෙනවා; හෙල්ලුම් කනවා.

මේ මහ පොළොව කම්පාවෙනවා කියන්නේ, භූමිකම්පාවක් සිද්ධ වෙනවා කියන කාරණය නෙවෙයි. මහ පොළොව කම්පාවෙනවා කියන්නේ, පින්වතුන්ලාට පැහැදිලිව දකින්න පුළුවන් දෙයක් තමයි, ඔබලා දකිනවා ඇති සමහර වෙලාවට හයියෙන් අකුණු ගහලා, හයියෙන් ගොරවලා, හයියෙන් විදුලි කොටන කොට මේ මහ පොළොවත් හෙල්ලෙනවා. මේ මහ පොළොව කම්පාවෙනවා කියන්නේ, මෙවැනි කම්පාවීමක්; සතර මහා ධාතුවේ කම්පාවීමක්. නැතුව, භූමිකම්පා වෙනවා වගේ මහ පොළොව පෙරළෙන්නේ නෑ. ඒ වගේ දැන් මහ පොළොව කම්පාවෙනවා, මේ දෙන්නාගේ වෙන්වීමට. මොකද, අසංඛ්‍ය කල්ප ලක්ෂ ගාණක ආදරයේ බැඳීමක් මේ වෙන්වෙන්නේ.

මේ පොළොව කම්පාවෙනකොට බුදුරජාණන් වහන්සේ දකිනවා, ඇයි මේ පොළොව කම්පා වුණේ කියලා. එතකොට, බුදුරජාණන් වහන්සේ දිවසින් දකිනවා, මේ පොළව කම්පා වුණේ, මේ සා දීර්ඝ ආදර බැඳීමක්... මෙන්න මේ පිප්පලී මගේ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ ධූතාංගධාරී භික්ෂූන් අතර අග්‍රස්ථානයට පත්වෙන කාශ්‍යප මහ රහතන් වහන්සේත්, ඒ වගේ ම මගේ භික්ෂුණී ශාසනයේ පූර්වේ නිවාසානුස්සති ඥානය අතින් ඉහළ ම තැනට පත්වෙන භද්දකාපිලානා රහත් භික්ෂුණියත් පැවිද්ද උදෙසා වෙන් වුණා ය කියන කාරණය දකිනවා.

දැන් දෙන්නා දෙපැත්තට යනවා. මේ දෙන්නාගේ නැවත මුණගැසීමක් නැහැ. දැන් ඊට පස්සේ මෙහෙම දවසක්, දෙකක්, තුනක් යනකොට පිප්පලීට පේනවා, ඈත ගසක් මුල, දහස් ගාණක් වටකරගෙන බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරනවා. නමුත් මීට ඉස්සෙල්ලා පිප්පලී බුදුරජාණන් වහන්සේව දැකලා තිබුණේ නැහැ. නමුත්, තව ම කිට්ටුවට ගිහිල්ලා නැහැ, ඡායාව ඈත පේන්නේ. ඒ පේන කොට ම නෝනා, අර බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන්, බුද්ධ අසිරියෙන් පිප්පලී

හඳුනගන්නවා, මේ නම් අනිවාර්යයෙන් ම බුදුරජාණන් වහන්සේ ම යි කියලා. තව ම දැකලා නැහැ. නමුත් අර දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් තුළින් හිතනවා, අනිවාර්යයෙන් ම මේ නම් බුදුරජාණන් වහන්සේ ම යි කියලා. ඒ තීරණයට ආපු තැන දී ම එයා බිම දිගාවෙනවා.

දැන් මෙච්චර වෙලා කකුල් දෙකෙන් ඇවිදගෙනනේ ආවේ. දැන් පිප්පලී බිම දිගාවුණා. එයා දකින වෙලාවෙ ම, බුදුරජාණන් වහන්සේ ම යි කියලා අනිවාර්යෙන් ම හඳුනගෙන බිම දිගාවෙනවා. දිගාවෙලා, බිම බඩගාගෙන, දොහොත් මුදුන් දීලා සාධුකාර දෙමින් තමයි, බුදුරජාණන් වහන්සේ ළඟට එන්නේ. ඇවිදගෙන නෙමෙයි එන්නේ. බිම බඩගාගෙන එන්නේ. මේ අතපය තුවාල කරගෙන, හූරගෙන තමයි, බුදුරජාණන් වහන්සේ ළඟට එන්නේ. ඇවිල්ලා, බුදුරජාණන් වහන්සේට වන්දනා කරනවා.

ඒ වන්දනා කරන වෙලාවේ, බුදුරජාණන් වහන්සේ කියනවා, "මම සම්මා සම්බුද්ධත්වයට පත් නො වී මේ පිප්පලීගේ වන්දනාව පිළිගත්තා නම්, මගේ හිස හත් කඩකට පුපුරනවා" කියලා. මොකද, ඒ තරම් පිප්පලීගේ ශ්‍රද්ධාව බලවත්. එතැනදී, උතුම් පැවිදි උපසම්පදාව ලබලා, දවස් හතක් ඇතුළත, හත්වෙනි දවසේ උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්නවා.

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ සූත්‍රයකින් දේශනා කරනවා, "මම ගිහි පින්වතුන්ලාට ණය වෙලා පිණ්ඩපාතය වැළඳුවේ දවස් හතයි" කියලා. මෙතන හරි සියුම් ධර්මයක් තියෙනවා, අපට මතු කරලා ගන්න, වර්තමාන සංඝයා හැටියට. ඒ කියන්නේ, උතුම් රහත් ඵලයට පත්වෙන තාක්කල් අපේ පිණ්ඩපාතෙට අපි දශමෙක හරි ණයකාරිත්වයක් තියෙනවා. එහෙම නැත්නම්, කාශ්‍යප මහ රහතන් වහන්සේට එහෙම ධර්මයක් කියන්න අවශ්‍යතාවයක් නැහැ. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ කියන සූත්‍රගත ධර්මයක් මේක, "මම ගිහි පින්වතුන්ලාට ණය වෙලා පිණ්ඩපාතය වැළඳුවේ දවස් හතයි" කියලා.

එතකොට දැන් බලන්න, මේ මොකක්ද මම කිව්වේ, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ සුපටිපන්න ගුණය. එතකොට මේ සුපටිපන්න ගුණය තුළින් තමයි උජුපටිපන්න ගුණය සකස් වෙන්නේ. එතකොට මේ ශ්‍රේෂ්ඨ අත්හැරීම නිසා, මේ කාමයන්ගේ නිසරු භාවය දැකීම නිසා මධු සමය දවසේ මධු රාත්‍රියේදීත් බ්‍රහ්මචාරීවයි ජීවත් වුණේ. ඊළඟට සකස් වෙන්නේ මොකක්ද? උජුපටිපන්න ගුණය.

උජුපටිපන්න ගුණය කියන්නේ මොකක්ද? සැබෑ ඍජු මාර්ගය. සැබෑ, ඍජු, දුක තුනී කරන, දුක නිවන මාර්ගය, තෘෂ්ණාව ප්‍රහීන කරන මාර්ගය වන ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරනවා. උජුපටිපන්න ගුණය. ඒක තමයි උජුපටිපන්න ගුණය කියන්නේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරනවා. එතකොට ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරන්නේ ඇයි? තෘෂ්ණාව ප්‍රහීන කරන, දුක නිරෝධය කරන, මේ ලෝක ධාතුව තුළ තියෙන එක ම එක මාර්ගය, ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එතකොට, ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කළා. උජුපටිපන්න ගුණය සකස් වුණා.

උජුපටිපන්න ගුණය නිසා ම දැන් ඊළඟට සකස් වෙන්නේ මොකක්ද? ඤායපටිපන්න ගුණය.

ඤායපටිපන්න ගුණය කියන්නේ මොකක්ද? ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරලා, එම භික්ෂුව සම්මා සතිය, සම්මා සමාධිය තුළින් මේ මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගය ම විදර්ශනා නුවණින් දැකලා, සම්මා ඤාණ, සම්මා විමුක්තිය සාක්ෂාත් කරගන්නවා.

දැන් එයා සම්මා ඤාණ, සම්මා විමුක්තිය සාක්ෂාත් කරගත්තේ කුමක් නිසා ද? ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කිරීම නිසා. අන්න ඤායපටිපන්න ගුණය. දැන් එයා සම්මා ඤාණ තුළින් මොකක්ද දකින්නේ? එයා චුතූපපාත ඤාණයන් දකිනවා; පූර්වේ නිවාසානුස්සති ඤාණයන් දකිනවා; දිව්‍ය චක්ඛු, දිව්‍ය සෝත ඤාණයන් දකිනවා; සෝවාන්, සකෘදාගාමී, අනාගාමී ඤාණයන් එයා දකිනවා; තමා තුළින් මේ ඤායපටිපන්න ගුණය ඇති කර ගන්නවා. එතකොට ඤායපටිපන්න ගුණය ඇතිකර ගත්තේ කුමක් නිසා ද? උජුපටිපන්න ගුණය නිසා.

උජුපටිපන්න ගුණය ඇති වුණේ කුමක් නිසා ද? සුපටිපන්න ගුණය නිසා. යම් කෙනෙක්ගේ සුපටිපන්න ගුණය දුර්වල නම්, අනිවාර්යෙන් ම උජුපටිපන්න ගුණය දුර්වල වෙනවා. මොකද, එයා කාමයේ නිසරු බව දැකලා නැහැ. උජුපටිපන්න ගුණය දුර්වල වූ තැන සම්මා ඤාණ, සම්මා විමුක්තිය ගැන අපි කථා කරලා වැඩක් නැහැ.

එතකොට, මේ ඤායපටිපන්න ගුණය සකස්කරගත් කෙනා ඊළඟට මොකද කරන්නේ, සාමීචිපටිපන්න ගුණය සකස් කර ගන්නවා. සාමීචිපටිපන්න ගුණය කියන්නේ මොකක්ද? තමා ශීලය තුළින් ශක්තිමත් වෙමින් ශීලයේ ආනිශංස ලෝකයාට කියනවා. තමා සමාධිය තුළ ශක්තිමත් වෙමින් සමාධියට මාර්ගය ලෝකයාට කියනවා. තමා ප්‍රඥාව තුළ ශක්තිමත් වෙමින් ප්‍රඥාව ලබා ගැනීමේ මාර්ගය ලෝකයාට කියනවා. තමා ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත් වෙමින් ආර්ය අෂ්ටාංගික මාර්ගයට අදාළ ධර්මයන් ලෝකයාට කියනවා. තමා සුපටිපන්න ගුණය තුළ ශක්තිමත් වෙමින් කාමයන්ගේ නිසරු භාවය, සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය එයා ලෝකයාට කියනවා. දැන් මේක තමයි සාමීචිපටිපන්න ගුණය.

දැන් එතකොට බලන්න, සුපටිපන්න ගුණය නිසා උජුපටිපන්න ගුණය ඇති වුණා. උජුපටිපන්න ගුණය නිසා ඤායපටිපන්න ගුණය ඇති වුණා. ඤායපටිපන්න ගුණය නිසා සාමීචිපටිපන්න ගුණය ඇති වුණා. එයා ධර්මය තුළ ජීවත් වෙමින්, ධර්මය තුළ ගමන් කරමින්, ධර්මාවබෝධය ලබමින්, එයා ලැබුවා වූ අවබෝධය තුළ ඉඳගෙන ලෝකයාට ධර්මය දේශනා කරනවා, බුදුරජාණන් වහන්සේගේ සූත්‍රගත ධර්මයට අදාළව ධර්මය දේශනා කරනවා; බුදුරජාණන් වහන්සේගේ සූත්‍රගත ධර්මය විවරණය කරමින් ධර්මය දේශනා කරනවා. අන්න සාමීචිපටිපන්න ගුණය.

එතකොට, මේ ගුණයන් හතර නිසා මොකක්ද ඊළඟට සිද්ධ වෙන්නේ? මේ ලෝකයේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයින් අටදෙනා බවට සංඝයා පත්වෙනවා.

ශ්‍රේෂ්ඨතම පුද්ගලයින් අටදෙනා කියන්නේ කවුද? ශ්‍රද්ධානුසාරී, ධම්මානුසාරී සෝවාන් ඵලය, සකෘදාගාමී මාර්ගය, සකෘදාගාමී ඵලය; අනාගාමී මාර්ගය, අනාගාමී ඵලය; රහත් මාර්ගය, රහත් ඵලය.

එතකොට, මෙන්න මේ ශ්‍රේෂ්ඨ පුද්ගලයින් අට දෙනා ම ඉන්නේ කොතන ද? මේ තියෙන ශ්‍රේෂ්ඨ ගුණයන් හතර තුළ. සංඝයා කියන ශ්‍රේෂ්ඨ ගුණයන් හතර තුළයි, අර මුල් ගුණයන් හතර නිසා මෙන්න මේ ශ්‍රේෂ්ඨ ම පුද්ගලයින් අට දෙනා බවට සංඝයා පත්වෙන්නේ. එතකොට මේ ශ්‍රේෂ්ඨම පුද්ගලයන් අටදෙනා කියලා කියන්නේ කවුද? මේ ලෝකයේ ඉන්න ශක්‍රයා ද, සක්විති රජ්ජුරුවෝ ද, රටේ නායකයා ද, කවුද? ඒ සියල්ලට ම වඩා මේ පුද්ගලයින් අටදෙනා ශ්‍රේෂ්ඨයි. මොකද, අර සා ගුණයන් හතරක් නිසයි මේ ශ්‍රේෂ්ඨත්වයට පත්වෙන්නේ.

එතකොට, මේ ශ්‍රේෂ්ඨභාවය නිසා ම බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ආහුනෙය්‍යා, පාහුනෙය්‍යා, දක්ඛිණෙය්‍යො කියලා.

එතකොට ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො ගුණය කියලා කියන්නේ... සංඝයාගේ මේ ශ්‍රේෂ්ඨ ගුණයන් නිසා, සංඝයා මේ ලෝක ධාතුවේ ඉන්න ශ්‍රේෂ්ඨ ම පුද්ගලයින් අටදෙනා නිසා සංඝයා ආරාධනයකින් වැඩියත්, ආරාධනයකින් තොරව ආගන්තුකව වැඩියත්, දුර සිට වැඩියත්, ළඟ සිට වැඩියත් අපි ඒ සංඝයාව ගෞරවයෙන්, ශ්‍රද්ධාවෙන් යුතුව පිළිගන්නවා.

දැන් අපි ඈත ගම්මානවලට සමහර වෙලාවට ගියහම, ඒ ගම්මානෙක ගෙදරකට අපි වැඩියහම කවදාක්වත් ඒගොල්ලෝ අපෙන් හැඳුනුම්පත ඉල්ලන්නේ නැහැ; ඔබ වහන්සේගේ නම, ගම මොකක්ද කියලා අපෙන් අහන්නේ නැහැ. ඒගොල්ලෝ මොකද කරන්නේ? ගෙදරකට වඩින වෙලාවේ ඒගොල්ලෝ ගෙදර අල්මාරියයි අරින්නේ, මුලින් ම.

ඒ ගොවි ගෙවල්වල, දුප්පත් ගෙවල්වල එක සුදු සරමයි ඒ මහත්තයාට තියෙන්නේ. ඒ සරම තමා මඟුල් ගෙදර අඳින්නෙත්, මළගෙදර අඳින්නෙත්. ඇඳලා, හෝදලා, නවලා අල්මාරියේ තියලා තියෙනවා.

එතකොට, මේ අල්මාරියේ නමලා තියෙන, මඟුල් ගෙදර අඳින්න තියෙන සුදු සරම තමයි පුටුවට දාන්නේ. එතකොට මරණ ගෙදරකට යන්න, මඟුල් ගෙදරකට යන්න තියෙන සාරිය තමයි ගෙනල්ලා පාවඩයකට එළන්නේ.

අග්‍ර ම දේ දෙනවා; උතුම් ම දේ දෙනවා; පිරිසිදු ම දේ දෙනවා; ප්‍රනීත ම දේ දෙනවා. ඇයි ඒ? සංඝයා මේ ලෝකයේ ඉන්න ශ්‍රේෂ්ඨ ම පුද්ගලයින් අට දෙනා නිසා. ආහුනෙය්‍යෝ, පාහුනෙය්‍යෝ, දක්ඛිණෙය්‍යො කියන්නේ සියලුම ලැබීම්වලට ඉහළ ම සුදුස්සා කියන්නේ මහා සංඝයා ම යි.

ඒ නිසා නිරතුරුව ම සංඝයාගේ ගුණයන් දකින්න. සංඝයාගේ ගුණයන් දැකලා, මේ ආහුනෙය්‍ය ගුණය, පාහුනෙය්‍ය ගුණය, දක්ඛිණෙය්‍ය ගුණය කියන මෙන්න මේ ගුණයන් තුන තුළ ඉඳගෙන සංඝයාට දැක්විය යුතු ගෞරවයන් දක්වන්න අපි දක්ෂ වෙන්න ඕනේ.

දැන් අපි දකිනවා, සමහර වෙලාවට දානේ ගෙදරක් තිබ්බොත්, දානේ ගෙදරට ස්වාමීන් වහන්සේලා වඩිනවා. නමුත් කකුල් හෝදන්න තියෙන්නේ, පුංචි පරණ භාජනයක තමයි වතුර ටිකක් දාලා තියෙන්නේ.

මට මතකයි, මම එක් ගම්මානයක ගෙදරක පිණ්ඩපාතේ වඩිනකොට පුංචි ගෑනු දරුවෙක්ගේ පරණ ගවුමකින් තමයි මගේ කකුල් පිහිදැම්මේ. ඇයි ඒ? ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො ගුණය හඳුනන්නේ නැහැ. මට තේරුණා මේ පරණ ගවුමක් කියලා. නමුත් ඒකෙන් තමයි කකුල් පිහිදැම්මේ. මොකද, ඒ අවබෝධය නෑ; සංඝයා කියන ගුණයන් දකින්නේ නෑ.

ඒ නිසා නිරතුරුව ම සංඝයාත් එක්ක කටයුතු කරද්දී, සංඝයාට පූජාවන් පවත්වද්දී, අග්‍ර ම දේ, ප්‍රනීත ම දේ, ඉහළ ම දේ, පිරිසිදු ම දේ ගන්න.

දැන් මට මතකයි, ගිහි කාලේ දාන ගෙවල්, බණ ගෙවල් තිබුණා. දානේ ගෙදර ළංවෙන කොට, බණ ගෙදර ළංවෙන කොට අපි පිරුවට හොයනවා නේ ද? පිරුවට කියන්නේ මොනවාද? පරණ සුදු රෙදි.

එතකොට, ඒ පිරුවට සමහර විට ලොන්ඩරියට ගිහිල්ල ඒ කාලේ ගන්නේ. එතකොට, ඒ පිරුවටේ ම යි සමහර විට මළගෙදර දවසේ පාවඩේටත් දාන්නේ. පාවඩේ දාලා හෝදල තමයි තියෙන්නේ.

එතකොට මේ පිරුවටේ තමයි, ඇතිරිලිවලට නැත්නම් පාවඩවලට ඔක්කෝට ම එළන්නේ. එතකොට ඒක සුදුසු දෙයක් ද? සංඝයා කියන ගුණයට ගැළපෙනවා ද? ගැළපෙන්නේ නැහැ. අපි දකිනවා සමහර දුප්පත් ගෙවල්වල අර අල්මාරියේ නවල තියෙන සරම ගෙනල්ල තමයි පුටුවට දාන්නේ. ඒ සංඝයා කියන ගුණයන් කෙරෙහි තියෙන විශ්වාසය නිසා ඉහළ ම දේ, උතුම් ම දේ සංඝයාට දෙනවා.

ඒ නිසා නිරතුරුව ම සංඝයා උදෙසා දාන ගෙදරක් වේවා, බණ ගෙදරක් වේවා, පිරිත් ගෙදරක් වේවා ඒ අවශ්‍ය ඇතිරිලි වේවා, සියලුම සකස් කරන ඒ පිඟන් කෝප්ප වේවා, හැම දෙයක් ම ඉහළ ම දේ ගන්න. පිරිසිදු ම දේ ගන්න. හොඳ ම දේ ගන්න. ඒවා කොතනකදීවත් දුර්වල කර ගන්න එපා.

මොකද, මට මතකයි, මම එක්තරා ගෙදරකට ගියා. ඒක ගම්මානයක තියෙන ගෙදරක්. මාව හඳුනන්නේ නැහැ, කවුද කියලා දන්නේ නැහැ. ඒ ගෙදරට දානෙකට වැඩියට පස්සේ කකුල් දෙක සෝදලා ගේ ඇතුළට ගනිද්දී නෝනා, පාවඩයක් එළලා තිබ්බා. ඒ ගෙදර හිටියේ තරුණ ජෝඩුවක්. අර පාවඩයට කකුල තියන කොට ම මම දැනගත්තා, ඒ පාවඩය අර ගෙදර නෝනාගේ මඟුල් සාරිය බව. අර ගෙදර නෝනාගේ සුදු පාට මඟුල් සාරියයි.

එතකොට බලන්න, තමන්ගේ මඟුල් සාරිය සංඝයාට පාවඩයක් හැටියට එලුවෙ කුමක් නිසා ද? සංඝයාගේ ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය, දක්ඛිණෙය්‍ය ගුණය දකින නිසා. ඒ නිසා නිරතුරුවම අපි දක්ෂ වෙන්න ඕනේ. මොකද, ඒ වෙලාවේ ඒ ගෙදර අය භික්ෂුවක් ලෙස මාව හඳුනා ගත්තත් මම කවුද කියලා හඳුනගෙන නෙවෙයි ඒක කළේ. කොයි ස්වාමීන් වහන්සේ ඒ ගෙදරට වැඩියත් ඒ ගොල්ලන්ගේ ස්වභාවය ඒකයි. තේරුණා ද?

එතකොට බලන්න, ඒ ගෙදර ඉන්න නෝනා තමන්ගේ මඟුල් ගෙදරට තමයි ඒ සාරිය ගත්තේ. එතකොට, ඒ සාරිය ගන්න සමහර විට රුපියල්

විසිදාහක් විතර වැය වෙන්න ඇති. නමුත් ඒ රුපියල් විසිදාහක් වැය කරලා සාරිය අරගෙන මඟුල් ගේ දවසේ මනාලියක් හැටියට ඒක ඇන්දා. නමුත් ඒ ඇඳගත්ත සාරිය දැකලා එයත් කාමච්ඡන්දයන් ඇතිකර ගත්තේ. ඒ සාරිය ඇඳන් ඉන්නවා දැකපු මඟුල් ගෙදර ආපු හැමෝම ඇති කරගත්තේ මොකද්ද? කාමච්ඡන්දයක්. පංචනීවරණයක් සකස් කරගත්තේ. එයා සාරිය ඇඳලා, සාරියේ හැඩ බලබල, සාරියේ වර්ණය බල බල එයත් කාමච්ඡන්දයක් ම යි ඇති කරගත්තේ. ඒ මනමාලිව දැක්ක හැම කෙනෙක් ම ඒ සාරිය දැකලා කාමච්ඡන්දයක් ම යි ඇති කරගත්තේ. කාමච්ඡන්දය කියන්නේ මොකද්ද? අකුසලයක්. රුපියල් විසිදාහක් සාරියට වැය කරලා මඟුල් ගෙදර දවසේ ඒ සාරිය නිසා ඇති කරගත්තේ කාමච්ඡන්දයක්, අකුසලයක් පමණක් ම යි.

නමුත් ඒ සාරිය ඒ දරුවා මහා සංඝරත්නයට පාවඩයක් කරලා දාද්දී, ඒ සාරිය වෙනුවෙන් වැය කරපු රුපියල් විසිදාහට සැබෑ ම වටිනාකම ඒ දරුව ගත්තා. සැබෑ ම වටිනාකම එදයි ඒ දරුව ගත්තේ. නමුත් ඒ සාරිය ඇන්ද මඟුල් ගෙදර දවසේ රැස් කළේ කාමච්ඡන්දයක් විතරක් ම යි; පංචනීවරණයක් විතරක් ම යි. නමුත් ඒ අල්මාරිය ඇතුළෙ තියෙන සාරිය අරගෙන, මහා සංඝරත්නයට, සංඝයාගේ ගුණයන් කෙරෙහි විශ්වාසයෙන් පාවඩයක් කරලා දාද්දී නෝනා, රුපියල් විසිදාහක් ද සාරියට වැය කළේ? රුපියල් ලක්ෂ ගාණක ප්‍රතිලාභයක් එයා ගත්තා. ඒ දරුවා මැරෙන වෙලාවට මහා සංඝරත්නයට එලුව ඒ පාවඩේ සිහියට ආවොත් නෝනා, මහා යසඉසුරු සම්පත් තියෙන, මහා ධන කුවේර පවුලක තමයි උත්පත්තිය ලබන්නේ.

දැන් බලන්න, අර රුපියල් විසිදාහට දෙන්න තියෙන ශ්‍රේෂ්ඨ ම ලාභය, ප්‍රතිලාභය දුන්නේ මඟුල් දවසේ සාරිය ඇඳල ද? මහා සංඝරත්නයට පාවඩයක් කරල දාලා ද? එහෙනම් සංඝයා අරමුණු කරගෙන කරන පින්කම්වල දී ඔබ පිරුවට හොයන්න යන්න එපා. අල්මාරියේ තියෙන මඟුල් සාරිය අරන් දාන්න. ඒ මඟුල් සාරියට දෙන්න තියෙන සැබෑ ම වටිනාකම දුන්නා වෙන්නේ එදාටයි. එතකොට මේ මොකද්ද අපි මේ දැක්කේ? සංඝයාගේ තියෙන්නා වූ ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො ගුණය.

මේ ගුණයන් නිසා අංජලිකරණීය ගුණය සකස් වෙනවා; මනුෂ්‍යයින්, දෙවියන්, බ්‍රහ්මයින් සංඝයාට වඳිනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යම් භික්ෂුවක් පැවිදි වෙන්න එන වෙලාවේ දෙවියෝ සතුටු වෙනව ලු, මෙන්න මේ භික්ෂුව මාරයාත් එක්ක සටනකට සූදානම් වෙනවා කියලා. පැවිදි වෙන වෙලාවේ දෙවියෝ කතිකා වෙනවා, මෙන්න මේ භික්ෂුව මාරයාත් එක්ක සටනකට සූදානම් වෙනවා කියලා. එයා පැවිදි වෙලා, සතිපට්ඨාන ධර්මයන් පුහුණු වෙන කොට ඒ දෙවියෝ සතුටු වෙනව ලු, මෙන්න මේ භික්ෂුව මාරයාත් එක්ක සටන් කරනවා කියලා.

එයා සතර සතිපට්ඨානය තුළ ජීවත් වෙලා, චතුරාර්ය සත්‍යය අවබෝධ කරන වෙලාවේ ඒ දෙවියන් සතුටු වෙනව ලු, මෙන්න මෙයා මාරයා පරාද කළා කියලා.

ඒ වගේ, දෙවියන්, බ්‍රහ්මයින්, මනුෂ්‍යයින් මේ උතුම් සංඝයා කියන ගුණයන්ට වඳිනවා. එතකොට, මේ සියලු ම ගුණයන් නිසා සංඝයා මේ ලෝක ධාතුවේ පවතින ශ්‍රේෂ්ඨතම පින්කෙත වෙනවා. පින්කෙත කියන්නේ මොකක්ද? යමක් වපුරලා වැඩි ම අස්වැන්නක් ගන්න කෙනෙක් බවට පත් වෙනවා. දැන් ඔබ වී කිලෝ එකක් වැපිරුවොත් ඒ වී කිලෝ එක නිසා ඔබට වී කිලෝ 25ක් අස්වැන්න විදිහට ගන්න පුළුවන් කියලා හිතමු. ඔබ මුං කිලෝ එකක් වැපිරුවොත් ඒකේ අස්වැන්න හැටියටත් මුං කිලෝ 25ක් විතර ලැබෙන්න පුළුවන්. ඒවයේ තියෙනවා යම් සීමාවක්.

නමුත් සංඝයා කියන පින්කෙතේ ඔබ අබ ඇටයක දෙයක් පැළ කළොත්, එයින් ලැබෙන්නා වූ අස්වැන්න, එහෙම නැත්නම් විපාකය මෙතෙකැයි කියලා කියන්නට බැහැ. එක ඉඳුල් බත් කටක් පූජා කරලා, ඒ ඉඳුල් බත් කට සංඝයාගේ ගුණයන් අරමුණු කරගෙන සංඝයාට පූජා කරලා, මැරෙන වෙලාවේ ඒ පින උපාදානය කරගෙන සශ්‍රීක දිව්‍ය සැප වින්ද දෙව්වරු ඉන්නවා.

ඒ නිසා නිරතුරුවම මේ සංඝයා කියන පින්කෙත ඇසුරු කරද්දී, හැම වෙලාවෙ ම පන්සලට යද්දී, ආරණ්‍යයට යද්දී, සංඝයා බලන්න යද්දී අබ ඇටයක දෙයක් හරි අරන් යන්න. කුමකට ද? පැළකර ගන්න.

අබ ඇටයක හරි දෙයක් අරන් යන්න. මොකද, ඔබ මේ යන්නේ මේ ලෝක ධාතුව තුළ තියෙන ශ්‍රේෂ්ඨ ම පුණ්‍යක්ෂෙත්‍ර දකින්නයි.

එතනදී ඔබ අපේ පන්සලේ නායක හාමුදුරුවෝ පුණ්‍යක්ෂෙත්‍රයක් වන්නේ කොහොමද කියලා ඔබ හිතන්න යන්න ඕන නැහැ. මෙතන සංඝයායි අරමුණු කර ගන්නේ. සංඝයා අරමුණු කරගෙන තමයි අපි ස්වාමීන් වහන්සේ මුණගැහෙන්න යන්නේ. ඉතින් ඒ ස්වාමීන් වහන්සේ ගැන පෞද්ගලිකව හිතන්න යන්න ඕන නැහැ. ස්වාමීන් වහන්සේලා සමඟ කරනු ලබන සෑම කටයුත්තක දී ම සංඝයා අරමුණු කරගෙන, මේ ලෝකයේ ජීවත්වන ශ්‍රේෂ්ඨ ම පුණ්‍යක්ෂෙත්‍ර කියන අරමුණ තුළ ඉඳගෙනයි අපි එතනට යන්නේ.

දූන් එතකොට, මොකක්ද මේ අපි දූක්කේ? සංඝයාගේ ගුණයන්. එතකොට, මේ සංඝයාගේ ගුණයන් නිරතුරුව හිතනකොට, දකිනකොට, මෙනෙහි කරන කොට මොකද වෙන්නේ? සංඝයාගේ ගුණයන් කෙරෙහි හිත ඍජුව පවතිනවා; සැලෙන්නේ නෑ. දූන් සුපටිපන්න ගුණය ගැන ඔබලාට අවිශ්වාසයක් නෑ. සාරිපුත්‍ර මහ රහතන් වහන්සේගේ, මුගලන් මහ රහතන් වහන්සේගේ, රාහුල මහ රහතන් වහන්සේගේ, ආනන්ද මහ රහතන් වහන්සේගේ සුපටිපන්න ගුණය ගැන ඔබලාට සැකයක් නැහැ. විවෘතයි. ඒ සුපටිපන්න ගුණය ගැන විවෘතයි.

ඒ නිසා නිරතුරුව ම නෝනා, මේ ගුණයන් මෙනෙහි කරන කොට, සජ්ඣායනය කරන කොට, නුවණින් දකින කොට, අන්න මොකද වෙන්නේ? සංඝානුස්සතිය කෙරෙහි හිත ඍජුව පවතිනවා. ඒ ඍජුව පවතින හිත, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සන්සිඳෙනවා කියලා. සන්සිඳෙනවා කියන්නේ, ධර්මයේ පස්සද්ධිය සකස් වෙනවා. ධර්මයේ පස්සද්ධිය සකස් වුණා වූ හිත සමාධිමත් භාවයට පත් වෙනවා කියලා කියනවා.

දැන් මම මේ දේශනා කරන්නේ දේවතානුස්සතියට යන මාර්ගය. හොඳ ද?

ඉස්සෙල්ලා ම බුද්ධානුස්සතිය තුළින් සිත සමාධිමත් සිතක් කරගන්නවා. ඊළඟට ධම්මානුස්සතිය තුළින් සමාධිමත් සිතක් ඇතිකර ගන්නවා. ඊළඟට සංඝානුස්සතිය තුළින් සමාධිමත් සිතක් ඇතිකර ගන්නවා.

එතකොට දැන් හතරවෙනුව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ශීලානුස්සතිය තුළින් සමාධිමත් සිතක් ඇතිකර ගන්න ය කියලා. ශීලානුස්සතිය තුළින් කොහොමද සමාධිමත් සිතක් ඇති කරගන්නේ? එයා නිරතුරුව ම සෑම උදෑසනක ම සිල්පද පහ සමාදන් වෙනවා. සිල්පද පහ සමාදන් වෙලා දිවිහිමියෙන් ඇස්දෙක වගේ සිල්පද පහ ආරක්ෂා කර ගන්නවා. සිල්පද පහ ආරක්ෂා කරලා, ඒ ආරක්ෂා කලා වූ ශීලය නිරතුරුව ම ආවර්ජණය කරනවා. අපි කොහේහරි ගියහම ගෙදර ඉන්න දරුව ගැන සිහිපත් කරනවා වගේ; බිරිඳ ගැන සිහිපත් කරනව වගේ. නිරතුරුව ම මම මේ සිල්පද පහ ආරක්ෂා කළා, මේ ශීලය නිසා මට මේ සංස්කාරයන් ජීවිතයට එකතු වුණා කියලා එයා දකිනවා. මේවායේ සංස්කාරයන් නුවණින් මෙනෙහි කරන්න කියනවා.

දැන් සිල්පද පහ සමාදන් වෙලා හරියට ආරක්ෂා කරන කෙනාට ලැබෙන සංස්කාර මොනවා ද? එයා නිරතුරුව ම ජනප්‍රිය භාවයට පත් වෙනවා. එයා නිරතුරුව ම ඕන සභාවක් ඉදිරියට නොබියව යනවා. එයා නිරතුරුව සිහි මුළා නො වී මැරෙනවා. එයා නිරතුරුව ම සුගතියේ උපදිනවා. මේවා ශීලය රැකීම නිසා ලැබෙන්නා වූ සංස්කාරයන්.

කවුරුවත් සිල් රකින කෙනා ගැන බියක් ඇතිකර ගන්නේ නෑ. එයා බිය වෙන්නෙත් නෑ. කවුරුවත් එයා කෙරෙහි බිය ඇතිකර ගන්නෙත් නෑ. එතකොට මේ ශීලයේ සංස්කාරයන් නුවණින් දකිනවා. සමාජයේ ජනප්‍රිය චරිතයක් තියෙන කොට ඒ ජනප්‍රිය චරිතය තුළින් එයා දකින්නේ ජනප්‍රිය චරිතය නො වෙයි, ශීලයයි. මොක ද ශීලයේ ඵලයක් තමයි ඒ ජනප්‍රිය චරිතය කියන්නේ.

සමාජය තුළ නොබියව ජීවත් වෙන කෙනෙක් දකිනවා නම් එයා නොබියව ජීවත් වෙනවා කියලා නෙවෙයි දකින්නේ. ඒක ශීලයේ

ඵලයක් හැටියටයි එයා දකින්නේ. තේරුණාද? ඒ වගේ නිරතුරුව ම මේ ශීලයේ ආනිශංසයන් නුවණින් දකිනවා. ඒ ශීලයේ ආනිශංසයන් කෙරෙහි ඡන්දය, කැමැත්ත ඇතිකර ගන්නවා.

දැන් භික්ෂුවක් හැටියට මේ මොහොතේ මටත් පුංචි හෝ ජනප්‍රිය භාවයක් තියෙනවා. නමුත් මේ ජනප්‍රිය භාවය කියන්නෙ මොකක්ද? ශීලයේ ආනිශංස. පෙර ජීවිතයේ හෝ මේ ජීවිතයේ ශීලයේ ආනිශංසයක් තමයි ජනප්‍රිය භාවය කියන්නේ. මට නෙවෙයි, කාටත් පොදුයි.

නමුත් මේ ජනප්‍රිය භාවය නිත්‍ය ද, අනිත්‍ය ද? හෙට දවසේ මට වඩා විස්තරාත්මකව ධර්මය දේශනා කරන ස්වාමීන් වහන්සේ කෙනෙක් බිහි වුණොත් මට මොකද වෙන්නේ? ඒක තමයි, ශීලයේ සංස්කාර නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යයි. එහෙනම් මේ ලබන්නා වූ සංස්කාරයත් අනිත්‍යවන, සංස්කාරයක්. ඒ සංස්කාරයන් අනිත්‍ය වූ ධර්මයක් ම යි. තේරුණා ද?

එතකොට, නිරතුරුව ම මේ ශීලයේ ආනිශංස මෙනෙහි කරමින්, ශීලයේ ආනිශංස කෙරෙහි ඡන්දය ඇතිකර ගෙන ශීලය ආවර්ජනය කරන කොට, අන්න බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ශීලය කෙරෙහි හිත ඍජුව පිහිටනවා කියලා. එයා දැන් ශීලය තුළින් ම ශීලයේ ආනිශංස දකින කෙනෙක්. එයාට ශීලයේ ආනිශංස පිළිබඳ සැකයක් නෑ. විචිකිච්ඡාවක් නෑ. ශීලය තුළ සිත ඍජුව පිහිටනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ශීලය කෙරෙහි ඍජුව පිහිටුණා වූ හිත, සංහිඳෙනවා කියලා. සංහිඳෙනවා කියන්නේ පස්සද්ධිය සකස් වෙනවා. ඒ පස්සද්ධියට සකස් වුණා වූ හිත, අන්න බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සමාධිමත් සිතක් බවට පත්වෙනවා කියලා.

දැන් මොකද වුණේ? ශීලය තුළ ශක්තිමත් වුණා. ශක්තිමත් වුණා වූ ශීලය ආවර්ජනය කළා; මෙනෙහි කළා; නුවණින් දැක්කා; ආනිශංස දැක්කා. හිත ශීලය කෙරෙහි ඍජු භාවයට පත් කර ගත්තා. ඒ ඍජු වූ හිත සංහිඳුණා. සංහිඳුණා වූ සිත ශීලය තුළින් සමාධිමත් භාවයට පත් වෙනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, හැකිතාක් දන් දෙමින්, දානයේ ආනිශංස දකිමින්, දානය කෙරෙහි හිත ඍජු භාවයට පත්කර ගන්න කියලා. දැන් නිරතුරුව මහා සංඝරත්නය අරමුණු කරගෙන දන්දෙන කෙනා තුළ නිරතුරුව මොකක්ද වැඩෙන්නේ? වර්ණය, සැපය, බලය වැඩෙනවා. එතකොට, ඊට ශීලයත් එකතු වුණාම ආයුෂ, වර්ණය, සැපය, බලය මේ කාරණා හතර ම ජීවිතයට එකතු වෙනවා.

එතකොට, මේ දානයෙන් ලැබෙන්නා වූ ආනිශංස නුවණින් දකිමින්, දානය කෙරෙහි ඡන්දය, කැමැත්ත ඇතිකරගන්න කියනවා. සමාජයේ ආයුෂ, වර්ණය, සැපය, බලයෙන් පිරිච්ච මනුස්සයෙක් ජීවත් වෙනවා නම්, කෝටිපති මහත්මයෙක් ජීවත් වෙනවා නම්, ප්‍රභූ මහත්මයෙක් ජීවත් වෙනවා නම්, මහේශාක්‍ය මහත්මයෙක් ජීවත් වෙනවා නම් මේ දානයේ ඵලය හැටියට ම දකින්න කියනවා. සමාජය තුළ දුප්පත්, අනන්ත ප්‍රශ්න මැද්දේ ජීවත් වන චරිතයක් දකිනවා නම් දන් නො දීමේ ඵලය කියලා දකින්න කියනවා.

එතකොට, මේ දානයේ ආනිශංස මේ විදිහට නුවණින් දකිමින්, දානය කෙරෙහි ඡන්දය ඇතිකර ගනිමින්, මේ දානයේ ගුණයන් නුවණින් මෙනෙහි කරන කොට මොකද වෙන්නේ? දානයේ ආනිශංස කෙරෙහි හිත ඍජුව පවතිනවා.

එයාට දානයේ ආනිශංස කෙරෙහි සැකයක් නැහැ; විචිකිච්ඡාවක් නැහැ. එයා දානයේ ආනිශංස තමා තුළින් දකිනවා. එතකොට, ඒ දානයේ ආනිශංස කෙරෙහි, දානය කෙරෙහි හිත ඍජුව පවතින කොට, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඒ ඍජුව පවතින්නා වූ සිත සංසිඳෙනවා කියලා. පංචනීවරණ යටපත් වෙනවා. ඒ පංචනීවරණ යටපත් වුණා වූ හිත සමාධිමත් භාවයට පත් වෙනවා කියලා කියනවා.

දැන් එතකොට ක්‍රමානුකූලවයි මේක ආවේ. බුද්ධානුස්සතිය තුළින්. හිත සමාධිමත් කළා. ධම්මානුස්සතිය තුළින් හිත සමාධිමත් කළා. සංඝානුස්සතිය තුළින් හිත සමාධිමත් කළා. ශීලානුස්සතිය තුළින් හිත සමාධිමත් කළා. ත්‍යාගානුස්සතිය තුළින් හිත සමාධිමත් කළා.

දැන් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මෙන්න දැන් ඊළඟට දේවතානුස්සතිය වඩන්න කියලා. මෙතෙන්ට එනකොට හිත හොඳින් සමාධිමත් භාවයට පත්වෙලා තියෙන්නේ. පංචනීවරණ හොඳින් යටපත් වෙලා. ඒ පංචනීවරණ යටපත් වුණා වූ හිතෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දේවතානුස්සතිය දකින්න කියලා. කොහොමද දේවතානුස්සතිය දකින්නේ?

එයා නුවණින් දකිනවා, මේ තුසිතය, යාමය, නිම්මානරතිය, පරනිම්මිත වසවර්තිය, තාවතිංසය, චාතුර්මහා රාජිකය කියලා, සශ්‍රීක දිව්‍යතල හයක් තියෙනවා කියලා.

මේ සශ්‍රීක දිව්‍යතලවල මේ සත්ත්වයා, සතරවරම් දෙවියන්ගේ පටන් අප්‍රමාණ වූ මහා මහේශාක්‍ය, සුඛෝපභෝගී ජීවිත කරගෙන සශ්‍රීක දෙවියන්, දිව්‍යාංගනාවන් ජීවත් වෙනවා. මේ සෑම දෙවියෙක් ම, සෑම දිව්‍යාංගනාවක් ම දෙවියෙක්, දිව්‍යාංගනාවක් බවට පත්වුණේ ශ්‍රද්ධාව නිසා ම යි, ශීලය නිසා ම යි, ත්‍යාගය නිසා ම යි කියලා එයා දකිනවා. මගේ ජීවිතය තුළත් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තියෙනවා, ශීලය තියෙනවා, දානයෙන් මම පරිපූර්ණයි කියලා එයා දකිනවා. දකිමින් අර සශ්‍රීක දිව්‍යතල හයේ දෙවියන් කෙරෙහි, දිව්‍යාංගනාවන් කෙරෙහි උපාදානය, කැමැත්ත ඇති කරගන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මමත් දෙවියෙක් වෙනවා ය කියලා දකින්න කියනවා. මමත් දිව්‍යාංග නාවක් වෙනවා ය කියලා දකින්න කියනවා. ඒ දිව්‍යතලයේ ඉන්න දෙවියන් සමඟ, දිව්‍යාංගනාවන් සමඟ මනසින් ජීවත් වෙන්න, මනසින් කතා කරන්න, මනසින් දකින්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. දේවතානුස්සතිය. ඒ දිව්‍ය තලයේ ලස්සන දිව්‍ය විමානයක් හිස් ව තියෙනවා. ඒ දිව්‍ය විමානයේ දිව්‍යාංගනාවන් මහා විශාල පිරිසක් සිටියත් දිව්‍ය ආසනය හිස්ව තියෙනවා කියලා දකින්න කියනවා.

මොකද බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ජීවිතයේ කුසල් දහම් වඩන කෙනා, පින්කම් කරන කෙනා මැරෙන්න පෙරාතුව එයාට දිව්‍ය ලෝකයේ දිව්‍ය විමන් පහළ වෙනවා කියලා.

වරක් මුගලන් මහ රහතන් වහන්සේ දිව්‍ය තලයට වඩිනකොට දිව්‍ය විමානයක් තියෙනවා දකිනවා. ඒ දිව්‍ය විමානයේ මහා ලස්සන දිව්‍යාංගනාවෝ සිය ගණනක් ඉන්නවා. නමුත් ආසනය හිස් ව තියෙනවා, දෙවි කෙනෙක් නැහැ. මුගලන් මහ රහතන් වහන්සේ බුදු රජාණන් වහන්සේට ඇවිල්ලා කියනවා, "භාග්‍යවතුන් වහන්ස, මම මේ දිව්‍ය තලයට වැඩියා. නමුත් එක දිව්‍ය විමානයක් තියෙනවා. දිව්‍යාංගනාවෝ පිරිලා ඉන්නවා. නමුත් ආසනය හිස්, දෙවි කෙනෙක් නැහැ" කියලා.

ඒ වෙලාවේ බුදුරජාණන් වහන්සේ කියනවා, "මුගලන් මහ රහතන් වහන්ස, ඒ දිව්‍ය ආසනයේ ඉඳගන්න කෙනා තාම අන්න පණ අදිනවා අතන" කියලා. මනුස්ස ලෝකයේ තාම මැරෙන්න අවසාන මොහොතේ ඉන්නේ. එයාගේ පින නිසා අතන දිව්‍යතලයක් පහළ වෙලා තියෙනවා.

ඒ වගේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දේවතානුස්සතියේ දී නුවණින් දකින්න. තමාගේ ශ්‍රද්ධාව මතුකරගෙන, තමාගේ ශීලය මතුකරගෙන, තමාගේ දානය මතුකරගෙන ඒවායේ ශක්තිය නිසා දිව්‍යතලයේ දිව්‍ය විමානයක් පහළ වෙලා තියෙනවා, නුවණින් දකින්න කියනවා.

ඒ දිව්‍ය තලයේ හිස්ව තියෙන දිව්‍ය ආසනය නුවණින් දකින්න කියනවා. එහි දිව්‍යාංගනාවෝ ඔබ එනකල් බලාගෙන ඉන්නවා නුවණින් දකින්න කියනවා. ඒ දිව්‍ය විමානයේ තියෙන දිව්‍ය මල් ගොමු, දිව්‍ය සතුන්, දිව්‍ය තූර්යනාද, දිව්‍ය සංගීතය මේවා නුවණින් දකින්න කියනවා. දකිමින් දිව්‍යතලය කෙරෙහි ඡන්දය ඇතිකරගන්න කියනවා.

අපි නිරතුරුව ම දිව්‍ය තලය හිතෙන් මවාගෙන, මා වෙනුවෙන් දිව්‍ය තලයේ හිස් දිව්‍ය විමානයක් තියෙනවා, දිව්‍යාංගනාවෝ බලාගෙන ඉන්නවා ය කියන කාරණය උපාදානයක් හැටියට ගනිද්දී නෝනා, මැරෙන වෙලාවේ අපිට එක පාරටම මතක් වෙන්නේ මොකක්ද? අර දිව්‍ය විමානය. තේරුණාද? උපාදාන පච්චයා භවො. මොකද, දැන් මෙතන ශ්‍රද්ධාව, ශීලය, ත්‍යාගය තියෙනවා. ආයිමත් අමුතුවෙන් ම

ඒවා මතක් කරන්න ඕනේ නැහැ. ඒ නිසා නිරතුරුව ම මේ දෙවියෝ, දිව්‍යාංගනාවෝ, මේ සශ්‍රීක දිව්‍යතල උපාදානය කරමින්, මමත් දෙවියෙක්, මමත් දිව්‍යාංගනාවක් වෙනවා ය කියලා සෑම නිමේෂයක ම හිතමින්, දකිමින්, හිතමින්, දකිමින් ජීවත් වෙන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මෙතැනදී නෝනා, දැන් කොතෙන්ටද අපි අවසානේ ආවේ? දේවතානුස්සතිය කියන තැනට. එතකොට, දැන් බුද්ධානුස්සතියෙන්, ධම්මානුස්සතියෙන්, සංඝානුස්සතියෙන් හිත ඍජුව පිහිටුවා ගත්තා. ඒ තුළින් හිත සමාධිමත් කර ගත්තා. ශීලානුස්සතියෙන්, ත්‍යාගානුස්සතියෙන් හිත සමාධිමත් කර ගත්තා; හිත ඍජුව පිහිටුවා ගත්තා. ඒ තුළින්, නෝනා දැන් අවසානයේ දේවතානුස්සතිය කෙරෙහි හිත ඍජුව පිහිටනවා.

දැන් එයාට දේවතානුස්සතිය කෙරෙහි සැකයක් නැහැ. එයා දන්නවා ශ්‍රද්ධාව නිසා, දානය නිසා, ත්‍යාගය නිසා ඊළඟට මට ලැබෙන එක ම එක ඵලයයි දෙවියා, දිව්‍යාංගනාව කියන තැන. දැන් එයාගේ හිත ඍජුයි. සැලෙන්නේ නැහැ. කොතැනකවත් සැලෙන්නේ නැහැ. බියක් නැහැ. දැන් එයා නුවණින් දකිනවා, සෑම නිමේෂයක දී ම එයා දකිනවා, අර හිස්ව තියෙන දිව්‍ය විමානේ එයා උත්පත්තිය සකස්කර ගන්නවා ය කියන කාරණය.

එතකොට, එතැනින් ම එයාගේ හිත සන්සිඳෙනවා. සන්සිඳුණා වූ හිත මොකද වෙන්නේ, ධර්මයේ පස්සද්ධිය නිසා අන්න හිත සමාධිමත් භාවයට පත් වෙනවා. දැන් මොකද වුණේ? දේවතානුස්සතිය තුළින් හිත සමාධිමත් භාවයට පත් වුණා.

දේවතානුස්සතිය තුළින් හිත සමාධිමත් භාවයට පත්කරගෙන නෝනා, අන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ, මොකක්ද කියන්නේ? නමුත් මුලින් ම දේවතානුස්සතියට එන්න ඕනේ. දේවතානුස්සතිය ළඟට එන්නේ නැතිව දේවතානුස්සතියේ අනිත්‍යභාවය දකින්න යන්න එපා. මොකද, දේවතානුස්සතිය ළඟට ඇවිල්ල තමයි දේවතානුස්සතියේ අනිත්‍ය දකින්න කියන්නේ. අපිට තාම දේවතානුස්සතිය ළඟට එන්න

සුදුසුකම් මදි නම් කොයි වෙලාවකවත් දේවතානුස්සතියේ අනිත්‍යයි කියලා දකින්න එපා. මොකද එතනදී බලවත් අනතුරකට අපි පත් වෙනවා. තේරුණාද?

එතකොට, අපි මේ මාර්ගය තුළ නිරතුරුව ම ගමන් කරලා එන්න කියන්නේ නෝනා, නිරතුරුව ම අපි දේවතානුස්සතිය වඩාගෙන ඇවිල්ලම තමයි දේවතානුස්සතියේ අනිත්‍යභාවය දකින්න ඕනේ. මොකද, දිව්‍ය සංඥාවක් සකස් වෙද්දී නිරතුරුව ම ඒ දිව්‍ය සංඥාව හරි ම ආලෝකවත්. ප්‍රභාශ්වර සංඥාවක්. මැරෙන වේලාවේ ඒක්කෝ ලස්සන ආලෝකයක් පේනවා. ලස්සන දෙවියෙක් පේනවා. ලස්සන මල් ගොමුවක් පේනවා. ලස්සන දිව්‍ය විමානයක් පේන්නේ. එතැනදී අපි නිරතුරුව ම ඒකට ඇලෙනවා. එතකොට, ඒකට ඇලෙන නිසා අපි මුලින් ම ඒ දිව්‍ය ස්වභාවය නුවණින් දකින්න ඕනේ. දිව්‍ය අසිරිය මේ වගේ දෙයක්, දිව්‍යාංගනාවෝ, දෙවියෝ, දිව්‍ය විමාන... මේ මේ සුන්දරත්වය දකිමින්, දකිමින, දකිමින් මේකේ අනිත්‍යභාවය දකින්න ඕනේ.

එතකොට මේ සුන්දරත්වය අපි දකින්නේ නැතුව, දේවතානුස්සතිය අනිත්‍යයි, අනිත්‍යයි කියලා දක්කොත් මොකද වෙන්නේ? මැරෙන වෙලාවේ අර වගේ සුන්දර දෙවියෙක් දක්කොත් අපිට අනිත්‍ය භාවය හිතන්න බැරිව යනවා. මොකද, දෙවියා අනිත්‍ය වශයෙන් දක්කේ නැහැනේ. නේද? ඒ නිසා මුලින් ම දේවතානුස්සතිය කියන තැනට එන්න වෙනවා; දේවතානුස්සතිය තුළින් මේ දිව්‍ය අසිරිය කියන දේ අප හරියටම ජීවිතයට එකතුකර ගන්න වෙනවා.

දෙවියා කියන්නේ මේ වගේ අසිරිමත් කෙනෙක්, මේ වගේ සැපවත් කෙනෙක්, මේ වගේ සුබෝපභෝගී කෙනෙක් කියන කාරණය අපි දකින්න ඕනේ. එහෙම දකලා පුහුණු වුණාට පස්සේ මැරෙන වෙලාවේ අර වගේ සශ්‍රීක දෙවියෙක් දැක්කොත් මොකද කරන්නේ? අපි අනිත්‍යයි කියලා දකිනවා. මොකද අපි ඒක පුහුණු වෙලානේ තියෙන්නේ, නේද?

නමුත් අපි දේවතානුස්සතිය වඩන්නේ නැතිව, අපි අනිත්‍ය කියලා දකින්න හිතාගෙන ඉන්නවා නම්, අර සුරූපී දෙවියෙක්, දිව්‍යාංගනාවක් දකින කොට ම අපි ඒකට බැඳෙනවා. බැඳුණට පස්සේ අපට අනිත්‍යය දකින්න බැහැ. අපි දිව්‍ය තලයේ ගිහිල්ල උපදිනවා. තේරුණාද?

නමුත් දේවතානුස්සතියේ අනිත්‍ය භාවය වැඩුවේ නැති නිසා අපිට සෝවාන්, සකෘදාගාමී, අනාගාමී ඵලයන්ට යන්න බැහැ. ඒ නිසා මේ මාර්ගයේ ගමන් කරලා, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකරගෙන, ශීලය තුළින්, දානය තුළින් සමාධිමත් සිතක් සකස් කරගෙන, දේවතානුස්සතිය කෙරෙහි උපාදානය ඇතිකර ගෙන, ඊට පස්සෙයි අපි දේවතානුස්සතිය අනිත්‍ය කියලා දකින්න ඕන.

ඉස්සර වෙලා ම දේවතානුස්සතිය පුහුණු කරන්න ඕන. දේවතානුස්සතිය පුහුණු කරලා ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ දේවතානුස්සතියත් අනිත්‍යයි කියලා දකින්න කියලා.

මේ දේවතානුස්සතිය අනිත්‍යයි කියලා දකින්නේ කොහොම ද? එයා දැන් දකිනවා, මම දෙවියෙක් වුණේ කුමක් නිසා ද? තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව නිසා. බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය නිසා, ශීලානුස්සතිය නිසා, ත්‍යාගානුස්සතිය නිසයි මම දෙවියෙක් බවට පත් වුණේ.

නමුත් මේ බුද්ධානුස්සතිය තුළින් රැස්වෙන්නා වූ සංස්කාර නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යයි. ධම්මානුස්සතිය තුළින්, සංඝානුස්සතිය තුළින් රැස්වෙන්නා වූ සංස්කාර නිත්‍ය ද අනිත්‍ය ද? අනිත්‍ය යි. ධම්මානුස්සතිය තුළින්, සංඝානුස්සතිය තුළින් රැස්වෙන්නා වූ සංස්කාර නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍ය යි. ශීලානුස්සතිය තුළින් ත්‍යාගානුස්සතිය තුළින් රැස් වුණා වූ සංස්කාර නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි. මේ සියල්ලම අනිත්‍ය නම් මේ සංස්කාර නිසා සකස් වුණා වූ දේවතානුස්සතිය නිත්‍ය වේ ද? අනිත්‍ය වේ ද? අනිත්‍ය වූ ධර්මතාවක්.

අන්න දැන් එයා මේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, ශීලයත්, දානයත් අනිත්‍ය වශයෙන් දකිනවා. මේ සංස්කාර අනිත්‍ය නම්, මේ මම උපාදානය කරගෙන ඉන්න දේවතානුස්සතියත්, දෙවියාත් අනිත්‍යයි කියලා එයා දකිනවා.

එයා බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙන ආකාරයට, අර දිව්‍ය තලයේ කොච්චර මහේශාක්‍ය සශ්‍රීක දෙවිවරු සිටියත්, ඒ දෙවියන්ගේ පින පිරිහුණු තැන ඒ දෙවියන්ගේ දිව්‍ය ශරීරවලට දහඩිය දමනවා; දුගඳ හමනවා. මල් පරවෙනවා. ඒගොල්ලෝ ඇඳගෙන ඉන්න ලස්සන ඇඳුම් අතුරුදහන් වෙනවා; ලස්සන ආභරණ අතුරුදහන් වෙනවා. ඒ අතුරුදන් වෙනකොට ඒගොල්ලෝ වේදනාවෙන් හඬා වැටෙන හැටි එයා නුවණින් දකිනවා. දෙවියාටත් මේ ජාති, ජරා, ව්‍යාධි, මරණ, දුක, මේ චුතවීමේ දුක උරුමයි කියලා දකිනවා. දකිමින් එයා දේවතානුස්සතියේ අනිත්‍යභාවය ජීවිතයට එකතුකර ගන්නවා.

ඊට පස්සේ එයා දේවතානුස්සතියට ඇලෙනවද? නැහැ. නමුත් එයා මුලින් ම දෙවියාට ඇලුණා. මුලින්ම දෙවියාට ඇලිලා තමයි ඊළඟටයි දේවතානුස්සතියේ අනිත්‍යභාවය දකින්නේ. එයා දකිනවා, මේ මොහොතේ ශක්‍රයා කියලා කෙනෙක් ඉන්නව. ඒ ශක්‍රයාත් සතර අපායෙන් මිදිලා නැත්නම්, ඒ ශක්‍රයා ආයිමත් සතර අපායට වැටෙනවා කියලා එයා දකිනවා. මේ ලෝකයේ ශක්‍රයාත් යම් දවසක නිවන් අවබෝධ කරගෙන, මේ ලෝක ධාතුවෙන් නිවිලා යනවා කියලා දකිනවා. එහෙනම් දේවතානුස්සතියත් එයා අනිත්‍යයි කියලා දකිනවා.

එතකොට මේ වගේ නෝනා, බුදුරජාණන් වහන්සේ, ගිහි පින්වතුන්ලාට නිරතුරුව ම පුහුණු කරන්න පුළුවන්, මේ මනුස්ස ජීවිතයක් ලබා ගන්න කෙනා ඊළඟ ජීවිතයේ දී දිව්‍ය තලයේ උපතකට යන්න ඕනේ නම් ඒ දිව්‍ය තලයේ උපත ලබා ගන්න පුළුවන් භාවනාවක්, කමටහනක් හැටියට දේශනා කරන්නේ නෝනා, දේවතානුස්සතිය යි.

ඒ නිසා නිරතුරුව ම බුදුරජාණන් වහන්සේගේ ගුණයන් සිතමින්, ධර්මරත්නයේ ගුණයන් සිතමින්, මෙනෙහි කරමින්, සංඝරත්නයේ ගුණයන් නුවණින් දකිමින්, මෙනෙහි කරමින් තෙරුවන් කෙරෙහි සිත ඍජුභාවයට පත්කර ගන්න.

ඒ ඍජුභාවය තුළින් සන්හිඳුණු සිතක් ඇතිකර ගෙන, ඒ සිත සමාධිමත් සිතක් බවට පත්කර ගන්න.

සමාධිමත් වුනා වූ සිත තුළින් ශීලානුස්සතිය මෙනෙහි කරන්න.

ඒ ශීලානුස්සතිය තුළින්, සමාධිමත් වුනා වූ සිත තුළින් ත්‍යාගානුස්සතිය මෙනෙහි කරන්න.

ත්‍යාගානුස්සතිය තුළින් සමාධිමත් වුණා වූ සිත තුළින් දේවතානුස්සතිය මෙනෙහි කරන්න.

දේවතානුස්සතිය කෙරේ සමාධිමත් වුනා වූ සිත තුළින් ඒ දේවතානුස්සතියත් අනිත්‍යයි කියලා දැකලා විදර්ශනා නුවණ සකස් කරගෙන මාර්ගඵලලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක් වෙන්න කියන කාරණය දකින්න කියලා තමයි බුදුරජාණන් වහන්සේ එතැනදී දේශනා කරලා තියෙන්නේ.

සාධු! සාධු!! සාධු!!!

මේ පින...
නිවන් අවබෝධවීම පිණිසම...
හේතු වේවා!
ඉමිනා පුඤ්ඤ කම්මේන
මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු
යාව නිබ්බාන පත්තියා....

මේ කුසලයෙන්
නිවන් දකිනාතුරුම
පස්පව්, දස අකුසල් කරන,
බාලයන්ගේද
අසත්පුරුෂයන්ගේද
පාප මිත්‍රයන්ගේද
ආශ්‍රය නොලැබේවා!

දානාදී පින්කම් කරන
ශීලාදී අනන්ත ගුණ පුරන
විදර්ශනාදී භාවනා වඩන
සත් පුරුෂයන්ගේද
කල්‍යාණ මිත්‍රයන්ගේද
බුද්ධාදී ආර්ය මහෝත්තමයන්ගේද
ආශ්‍රයම ලැබේවා!

## ''මහ රහතුන් වැඩි මඟ ඔස්සේ''
## දහම් පුස්තක මාලාවේ මෙතෙක් නිකුත් වී ඇති දහම් පුස්තකයන්

**''මහ රහතුන් වැඩි මඟ ඔස්සේ'' පොත් මාලාව (අතහැරීම 1-9 දක්වා)**

- මහ රහතුන් වැඩි මඟ ඔස්සේ අතහැරීම 01 (2012 මැයි සිට)
- මහ රහතුන් වැඩි මඟ ඔස්සේ අතහැරීම 02 (2012 සැප්තැම්බර් සිට)
- මහ රහතුන් වැඩි මඟ ඔස්සේ අතහැරීම 03 (2013 මැයි සිට)
- මහ රහතුන් වැඩි මඟ ඔස්සේ අතහැරීම 04 (සංශෝධිත මුද්‍රණය-2016 ජනවාරි සිට)
- මහ රහතුන් වැඩි මඟ ඔස්සේ අතහැරීම 05 (සංශෝධිත මුද්‍රණය-2016 ජනවාරි සිට)
- මහ රහතුන් වැඩි මඟ ඔස්සේ අතහැරීම 06 (2014 මාර්තු සිට)
- මහ රහතුන් වැඩි මඟ ඔස්සේ අතහැරීම 07 (2014 සැප්තැම්බර් සිට)
- මහ රහතුන් වැඩි මඟ ඔස්සේ අතහැරීම 08 (2015 සැප්තැම්බර් සිට)
- මහ රහතුන් වැඩි මඟ ඔස්සේ අතහැරීම 09 (2016 සැප්තැම්බර් සිට)

**''මහ රහතුන් වැඩි මඟ ඔස්සේ'' පොත් මාලාවේ ඉංග්‍රීසි පරිවර්තනයන්**

- Giving Up Part 1 (From January 2014)
- Giving Up Part 4 (From September 2016)
- Giving Up Part 5 (From September 2016)

**''මහ රහතුන් වැඩි මඟ ඔස්සේ'' අනෙකුත් පොත්**

- සතර අපායෙන් මිදීම (2014 පෙබරවාරි සිට)
- කාලෙන ධම්ම සාකච්ඡා (2014 නොවැම්බර් සිට)
- ආර්ය අෂ්ඨාංගික මාර්ගය (2015 පෙබරවාරි සිට)
- තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව පින්වත් ඔබට
  සැබෑම නිරෝගී භාවය ලබා දෙන එකම වෛද්‍යවරයායි (2015 මැයි සිට)
- ලස්සන වෙන්න කැමති පින්වත් දරුවන්ට මෙත් සිත (2016 මැයි සිට)
- හම්බන්තොට ධර්ම සාකච්ඡාව 01 (2016 මැයි සිට)
- හම්බන්තොට ධර්ම සාකච්ඡාව 02 (2016 ඔක්තෝබර් සිට)
- සතර අපායෙන් මිදීම උදෙසා දේවතානුස්සතිය (2017 මැයි සිට)
- මහ රහතුන් වැඩි මඟ ඔස්සේ ලිපි මාලාවේ රුවන් වැකි (2017 මැයි සිට)

**මහ රහතුන් වැඩි මඟ ඔස්සේ දහම් පුස්තක ඔබට ආසන්න
තැපැල් කාර්යාලය වෙතටද ගෙන්වා ගත හැක.**

**නිෂ්පාදන වියදමට දායක වී ඉහත සඳහන් ග්‍රන්ථයන්
ධර්ම දානයක් ලෙස බෙදා දීමට ලබා ගත හැක.**

**විමසීම්: 071 2199900**
**011 2755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා)**

නිරතුරුව ම බුදුරජාණන් වහන්සේගේ ගුණයන් සිතමින්,
ධර්මරත්නයේ ගුණයන් සිතමින්, මෙනෙහි කරමින්,
සංඝරත්නයේ ගුණයන් නුවණින් දකිමින්, මෙනෙහි කරමින්
තෙරුවන් කෙරෙහි සිත ඍජුභාවයට පත්කර ගන්න.

ඒ ඍජුභාවය තුළින් සන්හිඳුණු සිතක් ඇතිකර ගෙන,
ඒ සිත සමාධිමත් සිතක් බවට පත්කර ගන්න.

සමාධිමත් වුනා වූ සිත තුළින් ශීලානුස්සතිය මෙනෙහි කරන්න.

ඒ ශීලානුස්සතිය තුළින්, සමාධිමත් වුනා වූ සිත තුළින්
ත්‍යාගානුස්සතිය මෙනෙහි කරන්න.

ත්‍යාගානුස්සතිය තුළින් සමාධිමත් වුණා වූ සිත තුළින්
දේවතානුස්සතිය මෙනෙහි කරන්න.

දේවතානුස්සතිය කෙරේ සමාධිමත් වුනා වූ සිත තුළින්
ඒ දේවතානුස්සතියත් අනිත්‍යයි කියලා දැකලා විදර්ශනා නුවණ
සකස් කරගෙන මාර්ගඵලලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක් වෙන්න.

ISBN 978-955-7887-21-0

9 789557 887210

මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්

ධර්ම දානය පිණිස නොමිලේ බෙදා හැරීම සඳහාය